# පටුන


| | පිටු අංක |
|---|---|
| සභාපති තුමාගේ පණිවිඩය | 03 |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | 04 |
| **1. හැඳින්වීම** | 07 |
| 1.1. අපගේ දැක්ම | 08 |
| 1.2. අපගේ මෙහෙවර | |
| 1.3. අපගේ පස්විධ වටිනාකම් (Our Values) | |
| 1.4. අපගේ අභිමතාර්ථ හා අරමුණු සාරාංශය | 09 |
| 1.5. ශක්තීන් හා දුර්වලතා | |
| 1.6. අපගේ කාර්යභාරය | 10 |
| 1.7. අපගේ සම්පත් | 10 - 17 |
| 1.7.1. මානව සම්පත | |
| 1.7.1.1. කළමනාකරණ මණ්ඩලය | |
| 1.7.1.2. අධ්‍යයන මණ්ඩලය | |
| 1.7.1.3. විගණන හා කළමණාකරණ කමිටුව. | |
| 1.7.1.4. ආයතනයේ කාර්ය මණ්ඩලය | |
| 1.7.2. ආයතනික භෞතික සම්පත් | 18 - 24 |
| 1.7.2.1. කාර්යාල පරිශ්‍රය | |
| 1.7.2.2. දේශන ශාලා | |
| 1.7.2.3. සම්මන්ත්‍රණ ශාලා | |
| 1.7.2.4. නේවාසික පහසුකම් | |
| 1.7.2.5. වෙනත් භෞතික හා ප්‍රාග්ධන සම්පත් | |
| **2. ආයතනික ප්‍රගතිය** | 27 - 28 |
| 2.1. මුල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු | |
| 2.1.1. 2013 - 2017 වර්ෂික ආදායම | |
| 2.1.2. 2013- 2017 වාර්ෂික වියදම | |
| 2.1.3. 2013 - 2017 කාලය තුල භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන | |
| 2.1.4. 2013 - 2017 වර්ෂය තුල ආයතනික ඉපයීම්, වියදම් හා ප්‍රතිපාදන | |
| 2.1.5. 2013 - 2017 වර්ෂය තුල ලද භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් හා යෙදවීම | |
| 2.2. අධ්‍යයන කටයුතු පිළිබඳ ප්‍රගතිය | 29 - 32 |
| 2.2.1. ආයතනයේ අධ්‍යයන හා සංවර්ධන අංශය | |
| 2.2.2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරි පුහුණුව | |
| 2.2.2.1. සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව | |
| 2.2.2.2. සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව | |
| 2.2.3. ඩිප්ලෝමා පාඨමාලා | 32 - 34 |
| 2.2.3.1. සමුපකාරික වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා | |
| 2.2.3.2. තොරතුරු තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව | |
| 2.2.3.3. සමුපකාරික නොවන වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා | |

| | |
|---|---|
| 2.2.4. සහතික පත්‍ර පාඨමාලා | 34 - 35 |
| 2.2.4.1. සමුපකාරික වෘත්තීමය සහතික පත්‍ර පාඨමාලව | |
| 2.2.4.2. තොරතුරු තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලා | |
| 2.2.5. භාෂා සහතිකපත්‍ර පාඨමාලා | |
| 2.2.6. විෂයානුබද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් | 35 - 39 |
| 2.2.7. පුහුණු මාර්ගෝපදේශය අනුව පැවැත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන් | |
| 2.2.8. පුහුණු මාර්ගෝපදේශයෙන් බැහැරව පැවැත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන් | |
| 2.2.9. මහජන බැංකු ආධාර යටතේ පවත්වන ලද පාඨමාලා | |
| 2.2.10. අන්තර් ජාතික පුහුණු වැඩසටහන් | 39 |
| 2.2.11. වෘත්තීය පාඨමාලා සඳහා සිසුන් සූදානම් කිරීම | 40 |
| 2.2.12. ආයතනික සම්පත් උපයෝගී කරගෙන බාහිර ආයතන පැවැත්වූ පුහුණු වැඩසටහන් | 40-41 |
| 2.3. ආයතනයේ අධ්‍යයන පහසුකාරක සේවා ප්‍රගතිය | 40 - 42 |
| 2.3.1. නේවාසික අංශය | |
| 2.3.2. පුස්තකාල අංශය | |
| 2.3.3. විභාග අංශය | |
| 2.3.4. මුද්‍රණාල අංශය | |
| 2.3.5. ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය | |
| 2.3.6. ශ්‍රවනාගාරය | |
| 2.4. ආයතනික භෞතික සම්පත් සංවර්ධනය ප්‍රගතිය | 43 |
| **3. වර්තමාන අභියෝග** | 46 |
| **4. මූල්‍ය වාර්තා** | 49 - 64 |
| 4.1. 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය | |
| 4.2. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් වියදම් ප්‍රකාශය | |
| 4.3. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | |
| 4.4. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය | |
| 4.5. 2017.12.31 දිනට ගිණුම් සම්බන්ධ සටහන් | |
| **5. විගණකාධිපති වාර්තාව -2017** | **67 - 81** |

**සභාපතිතුමාගේ පණිවිඩය**

ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරයේ මානව සම්පත් සංවර්ධනය කිරිමෙහිලා පුරෝගාමී රාජ්‍ය මට්ටමේ ජාතික ආයතනයක් වශයෙන්, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2017 වර්ෂයේ පාලන වාර්තාව සඳහා එහි සභාපතිවරයා ලෙස පණිවුඩයක් නිකුත් කිරිමට ලැබීම පිළිබඳව සතුටු වෙමි.

2017 වර්ෂයේ දී ආයතනයේ භෞතික, මානව හා මුල්‍ය සම්පත් එහි අපේක්ෂිත අරමුණු සාධනය කරගැනීම උදෙසා කාර්යක්ෂමව හා සඵලදායි ලෙස උපයෝජනය කර ඇති ආකාරයත්, එහි ප්‍රගතිය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳවත් මනා අවබෝධයක් මෙම වාර්තාව මගින් ලබාගත හැක.

සීමිත ආයතනික සම්පත් මනා ලෙස කළමනාකරණය කරමින් ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යවසායන්හි තිරසාර සංවර්ධනයක් සඳහා එහි වැදගත්ම සම්පත වන මානව සම්පත දැනුම, කුසලතා, ආකල්ප හා ඊට අදාල පරිචයන්ගෙන් පරිපෝෂිත කිරිම සඳහා 2017 වර්ෂයේ දී ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ගෙන ඇති ප්‍රශංසනීය මෙහෙවර ආයතනයේ වත්මන් සභාපතිවරයා ලෙස අගය කරමි.

**"තිරසාර පැවැත්මක් සහිත නිර්මාණශිලි හා නව්‍යකරණයෙන් යුතු ගෝලීය සම්බන්ධතාවයන්ගෙන් සමන්විත සමුපකාර ජන සමාජයක් ස්ථාපිත කිරිමට"** ඇවැසි ආයතනික නිෂ්ටාව සාක්ෂාත් කරගැනීමට සමුපකාර ක්ෂේත්‍රයේ අධ්‍යයන පුහුණුව හා පර්යේෂණ කටයුතු ඉටු කරන ප්‍රමුඛතම ජාතික ආයතනයක් ලෙස ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරයේ මහගෙදර නමින් විරුදාවලියලත් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයට හා එහි සමස්ත කාර්ය මණ්ඩලයට අවශ්‍ය ශක්තිය ධෛර්ය නිරතුරුව ලැබේවායි! ඉති සිතින් ප්‍රාර්ථනා කරමි.

රෝහණ කීර්ති දිසානායක
සභාපති
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල

**අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය**

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2017 වාර්ෂික වාර්තාව එළිදැක්වෙන මෙම අවස්ථාවේ ඒ වෙනුවෙන් සමුපකාර ව්‍යාපාරයේත් ආයතනයේත් අභිවෘද්ධිය හා තිරසාර පැවැත්ම ප්‍රාර්ථනා කරමින් මෙම සටහන තබමි.

සීමිත මානව සම්පතක් සමග විවිධ දුෂ්කරතා හා අභියෝග හමුවේ 2017 වර්ෂයේ සැලසුම්ගත ඉලක්ක උපරිම මට්ටමින් ලඟාකර ගැනීමේහිලා කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයන මණ්ඩලය ප්‍රමුඛ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ගෙන ඇති මෙහෙවර අගය කරමි.

ගෝලීය වෙනස්කම් හමුවේ සමුපකාර ව්‍යාපාරය මුහුණ දෙන අභියෝග ජයගත හැකි පරිදි කටයුතු කිරීමට යෝග්‍ය මානව සම්පතක් බිහිකිරීමේ අවශ්‍ය මෙහෙවර ඉටුකිරීමටත් ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරය වෙත දැනුම සපයන්නා ලෙස විශිෂ්ඨත්වයට පත්වීමටත් ආයතනය වෙත ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ජී.එච්.එම්.ඒ. ප්‍රේමසිංහ
අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල

# හැඳින්වීම

**හැඳින්වීම**

ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ලෙස ප්‍රතිසංවිධානය කරන ලද්දේ එතෙක් පැවති සමුපකාර අධ්‍යාපන සම්ප්‍රදායෙන් මිදී ගෝලීයකරණ පරිසර සාධකයන්ට සාර්ථකව මුහුණ දියහැකි නව උපායමාර්ග හා ක්‍රමවේදයන් සපිරි අධ්‍යාපනයක් සමුපකාර ව්‍යාපාරයට ප්‍රදානය කිරීමේ අභිලාෂයෙනි. ඒ අනුව එතෙක් පැවති පොල්ගොල්ල සමුපකාර විද්‍යාලය 2001 අංක 01 දරණ පාර්ලිමේන්තු පනත මගින් ජාතික සමුපකාර සංවර්ධන ආයතනය නමින් සංස්ථාගත ආයතනයක් ලෙසට 2001 ජූලි මස 01 දින සංස්ථාපිත කරන ලදි.

එතෙක් සමුපකාර දෙපාර්තමේන්තුව මගින් පාලනය වූ සමුපකාර විද්‍යාලය ජාතික සමුපකාර සංවර්ධන ආයතනය නමින් ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙසට පරිවර්ථනය වෙමින් ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම කළමනාකරනය කිරීම සහ පාලනය කිරීම යන කාර්යයන් මේ පනතින් නව ආයතනය වෙත පවරා දී ඇති හෝ භාර කොට ඇති බලතල අනුව කළමනාකරණ මණ්ඩලයකට පැවරෙන්නේය.

එම කළමනාකරණ මණ්ඩලය රජයේ ප්‍රමුඛ අමාත්‍යාංශ කිහිපයක නියෝජිතයින්ගෙන් හා රාජ්‍ය හා පෞද්ගලික අංශවල විද්වත් පුද්ගලයින්ගෙන් සමන්විත වන්නේය.

සමුපකාර ක්ෂේත්‍රය ප්‍රමුඛ කරගනිමින් වෘත්තීය අධ්‍යාපනය දියුණු කිරීම තුළින් නිපුණතා සංවර්ධනය වැඩිදියුණු කිරිමටත්, ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපන හා පුහුණු ක්‍රමවේදයන්ට අනුගතවීමත් සැළකිල්ලට ගනිමින් නව ආයතනය ක්‍රියාත්මක වේ. මෙම අපේක්ෂාවන් ඉටුකරගැනීම සඳහා හිතකර වූ අධ්‍යාපනික පරිසරයක් හා ඉඩ පහසුකම් මෙම ආයතනය සතුව පැවතීම එම කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමට ප්‍රබල සාධකයක් වී ඇත.

සමුපකාරික අගයක් මත පදනම් වූ විවිධාංගිකරණයට යොමු වූ සමුපකාර ව්‍යාපාරය වෙනස්වන පරිසරයට අනුගත වෙමින් ගමන් කිරීමට අවශ්‍ය දැනුම, කුසලතාවය ලබාදීමේ පරමාර්ථයෙන් සමාලෝචිත වර්ෂය හැර ඩිප්ලෝමා, සහතිකපත්‍ර හා විෂයානුබද්ධ කෙටිකාලීන පාඨමාලා සහ කළමනාකරණ පුහුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

## 1. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2017 වාර්ෂික ක්‍රියාකාරීත්වය, අත්පත් කරගත් ප්‍රගතිය හා ආයතනික වර්තමාන අභියෝගයන් ද සංෂිප්ත ලෙස ඇතුලත් කෙරෙමින් 2017 වාර්ෂික වාර්තාව සකස්කර ඇත.

සමුපකාරික අධ්‍යාපනය ප්‍රමුඛ වගකීම වශයෙන් අයතනික පනත මගින් පවරා ඇති මෙම ආයතනය අදාල කාර්ය භාරය මෙන්ම ඉන් බැහැර වූ ක්ෂේත්‍රයන් වෙත ද තම අධයාපන හා සේවා පහසුකම් සැපයීමේ කාර්යයෙහි නිරතවන්නා වූ ජාතික ආයතනයකි.

### 1.1. අපගේ දැක්ම

ශ්‍රී ලංකාව තුළතිරසාර පැවැත්මක් සහිත නිර්මාණශීලී හා නව්‍යකරණයෙන් යුත්, ගෝලීය සම්බන්ධතාවයන්ගෙන් පිරිපුන් සමුපකාර ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම.

### 1.2. අපගේ මෙහෙවර

යහපාලනයෙන් හා නිර්මාණශීලීත්වයෙන් යුත් සාමූහික සහභාගිත්වය තහවුරු කෙරෙන ස්වාධීන හා තිරසාර සමුපකාර ව්‍යවසායයක් බිහිකිරීම සඳහා අවශ්‍ය මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම.

### 1.3. අපගේ වටිනාකම් (Our Values)




### 1.4. අභිමතාර්ථ හා අරමුණු සාරාංශය

මෙම ආයතනයේ කටයුතු විධිමත්ව පවත්වා ගැනීම සඳහා අභිමතාර්ථ 06 ඔස්සේ පිහිටුවාගත් අරමුණු 11

1. **අභිමතාර්ථය** සංවර්ධනය කරන ලද ප්‍රතිපත්ති හා කළමනාකරණය.
2. **අභිමතාර්ථය** ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරයට ප්‍රමුඛතාවය දෙමින් මානව ප්‍රාග්ධනය ඵලදායි ලෙස සංවර්ධනය කිරීම.
3. **අභිමතාර්ථය** සමුපකාර ව්‍යාපාරයට අදාළව ඉටු කරනු ලැබූ පර්යේෂණ සංවර්ධන කාර්යයන් පැවතීම.
4. **අභිමතාර්ථය** සමුපකාර ප්‍රතිපත්ති සිවිල් සමාජය තුළ ස්ථාපිතවීම.
5. **අභිමතාර්ථය** පුහුණුව හා සංවර්ධන සේවා අපේක්ෂාකරන පාර්ශවයන් සඳහා පහසුකම් සපයා තිබීම.
6. **අභිමතාර්ථය** ජාත්‍යන්තර සමුපකාර සංවිධාන හා වෙනත් විදේශීය සමුපකාර සංවිධාන සමඟ ශක්තිමත් වූ සබඳතාවයන් හා ගෝලීය නවප්‍රවනතාවයන් සහිත ලාංකීය සමුපකාර ව්‍යාපාරයක් පැවතීම.

ක් පෙළ ගස්වා ගනිමින් කාර්ය භාරය සැලසුම් කෙරේ.

### 1.5. ශක්තීන් හා දුර්වලතා



## 1.6. අපගේ කාර්ය භාරය

1945 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය 2001 අංක 01 දරණ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය සංස්ථාපනය කිරීමේ පනත මගින් ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද අවස්ථාවේ දී පනතේ පළමු කොටසේ 04වන වගන්තිය මගින් පහත සඳහන් කාර්යයන් ආයතනය වෙත පවරා ඇත.

i. සමුපකාර සංවර්ධනයට අදාළ ප්‍රවර්ධනය කිරීම සඳහා මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාකිරීම.
ii. වෙනත් දේ අතර,නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් සමුපකාර සංවර්ධනය පිළිබඳ පුහුණුව සැපයීම.
iii. සමුපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
iv. සමුපකාර සංවර්ධනයට සම්බන්ධ ක්‍රියාකාරකම්වල නියුක්තව සිටින තැනැත්තන් අතර,අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් සහ තොරතුරු හුවමාරු කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
v. සමුපකාර සංවර්ධනයට අදාළ දත්ත රැස්කිරීම අරබයා සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාකිරීම සහ රැස් කරන ලද එම දත්ත ප්‍රකාශනය කිරීම මගින් සංචයනය කිරීම හා පතළ කිරීම.
vi. සමුපකාර සංවර්ධනයට අදාළ විෂයයන් සම්බන්ධයෙන් ශාස්ත්‍රීය සහ පුහුණු පාඨමාලා පැවැත්වීම සහ එවැනි පාඨමාලා හදාරා නියමිත විභාගවලින් සමත්වන තැනැත්තන්ට සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පැවැත්වීම.
vii. කළමනාකරණ නිපුණතා අවශ්‍ය වන සමුපකාර ව්‍යවසායන් භාර ගෙන කළමනාකරණය කිරීම.
viii. සමුපකාර ව්‍යවසායවලට වෘත්තීය උපදෙස් සැපයීම.
ix. සමුපකාර ගම්මාන, ආදර්ශ සමුපකාර වෙළඳ මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවීම, සහ
x. ආයතනයේ කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටුකරන,ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පිහිටි සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

## 1.7. අපගේ සම්පත්

මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර - මඩවල මාර්ගයේ පොල්ගොල්ල මහවැලි හැරවුම් වේල්ල ආසන්නයේ පොල්ගොල්ල අධ්‍යාපන කේන්ද්‍රස්ථානය තුළ ස්ථානගතව ඇති අප ආයතනය මෙරට සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත ප්‍රවර්ධනය කිරීමෙහිලා පිහිටුවා ඇති (අක්කර 20ක භූමියක පැතිර ඇති) රාජ්‍ය අධ්‍යාපන ආයතනයකි.

### 1.7.1. මානව සම්පත

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය භෞතික හා මානව සම්පතින් පොහොසත් අධ්‍යාපන අයතනයක් වන අතර කළමනාකරණ මණ්ඩලයේ හා අධ්‍යයන මණ්ඩලයේ කළමනාකරණ හා ප්‍රතිපත්තිමය තීරණ මත ආයතනික කටයුතු පවත්වාගෙනයාමට කාර්ය මණ්ඩලය සැලසුම් කර ඇත.

#### 1.7.1.1. කළමනාකරණ මණ්ඩලය

2001 අංක දරණ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීමේ පනතේ 2 කොටසේ 5 වන වගන්තිය අනුව ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම, කළමනාකරණ මණ්ඩලය වෙත පැවරෙන්නේය. ඒ අනුව කළමනාකරණ මණ්ඩලය ආයතනයේ ඉහලම පරිපාලන ඒකකය වේ.

පනතේ 2 කොටසේ 6(1) උප වගන්තිය මගින් ආයතනික කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය දක්වා ඇති අතර ඒ අනුව පහත දැක්වෙන පත්කල සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

| | | |
|---|---|---|
| **නිල බලයෙන් පත්වන සාමාජිකයන්** | සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස, තත් කාලයේ තනතුර දරන්නා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙකු | 01 |
| | මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් | 01 |
| | ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සභාපතිවරයා | 01 |
| | පනතේ 16 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා | 01 |
| **පත් කරනු ලබන සාමාජිකයන්** | සමුපකාර ක්ෂේත්‍රයේ පුළුල් පළපුරුද්දක් සහ කළමනාකරණය පිළිබඳ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින්, සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් තිදෙනෙක් | 03 |
| | උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, | 01 |
| | මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක්. | 01 |
| එකතුව | | 09 |

කළමනාකරණ මණ්ඩලයට ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම පැවරෙන්නේය. එමෙන්ම, ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා මේ පනතින් ආයතනය වෙත පවරා දී ඇති, පනවා ඇති හෝ භාරකොට ඇති බලතල කාර්ය සහ කර්තව්‍ය කළමනාකරණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතුය.

මෙයට අමතරව ආයතනයේ සම්පත්, අරමුණු හා පරමාර්ථ ලඟා කර ගැනීම සඳහා මෙහෙයවමින් වාර්ෂික සංවර්ධන සැලසුම්, වාර්ෂික අයවැය ලේඛන, ඇගයීම හා අනුමත කිරීම, ප්‍රතිපත්ති සකස් කිරීම, ආයතනයේ කාර්යසාධනය කාලීනව අධීක්ෂණය කිරීම හා ඇගයීම, කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික මූල්‍ය වාර්තා හා විගණකාධිපති වාර්තා විශ්ලේෂණය කිරීම හා ඇගයීම, ප්‍රතිඵල, අපේක්ෂිත ඉලක්ක හා නොසැසදේ නම් අපේක්ෂිත අරමුණ ලඟා කර ගැනීමට අවශ්‍ය පිළියම් යෙදීම කළමනාකරණ මණ්ඩලයේ වගකීම වන්නේය.

සමාලෝචිත වර්ෂය තුල කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

| | තනතුර | නම |
|---|---|---|
| 1. | කළමනාකරණ මණ්ඩල සභාපති | **ලලිත් ගගේවත්ත මහතා** |
| 2. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **සුජාතා විජේසිංහ මහත්මිය,**<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය) |
| 3. | කළමනාකරණ මණ්ඩල සාමාජික | චින්තක එස්. ලොකුහෙට්ටි **මහතා,**<br>ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය- විශේෂ ශ්‍රේණිය |

| | | |
|---|---|---|
| 4. | කළමනාකරණ මණ්ඩල සාමාජික | කේ.ඩී.එන් රංජිත් අශෝක මහතා,<br>ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය- විශේෂ ශ්‍රේණිය. |
| 5. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **ඩී. පීවාන්නන්ද මහතා,**<br>කොමසාරිස් හා රේජිස්ට්‍රාර් ( මධ්‍යම රජය)<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය |
| 6. | කළමනාකරණ මණ්ඩල සාමාජික | එස්.එල් නසීර් මහතා<br>සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රේජිස්ට්‍රාර්<br>(මධ්‍යම රජය)<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය |
| 7. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **ඒ. ඩී.ඒ. කේ. නන්දසේන මිය**,<br>සහකාර අධ්‍යක්ෂ (මුදල්) මුදල් අමාත්‍යාංශය,<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය |
| 8. | කළමනාකරණ මණ්ඩල සාමාජික | කේ.කේ.එස්.ඒ පෙරේරා<br>අධ්‍යක්ෂ (මුදල්) මුදල් අමාත්‍යාංශය,<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය |
| 9. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **ඩී.එස්.එන්. හෙට්ටිගේ මහතා,**<br>අධ්‍යක්ෂ (සංවර්ධන)<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, |
| 10. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **ලලිත් පීරිස් මහතා,**<br>සභාපති, ජාතික සමුපකාර මණ්ඩලය |
| 11. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **එම්.එස්.එම්.රිස්මි මහතා** |

කළමනාකරණ මණ්ඩල රැස්වීමක් සඳහා ඝණපූර්ණය සමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, යටත් පිරිසෙන් මාස 3 කට වරක්වත් කළමනාකරණ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු බවට පනත මගින් විධිවිධාන සලසා ඇත.

සමාලෝචිත 2017 වසර තුළ කළමනාකරණ මණ්ඩල රැස්වීම් 04 ක් පවත්වා ඇත.

| අනු අංකය | නම | රැස්වීම් පැවැත් වු දින | | | |
|---|---|---|---|---|---|
| | | **1/3** | **30/5** | **3/8** | **10/11** |
| 1. | ලලිත් ගඟේවත්ත මහතා | ✓ | ✓ | ✓ | ✓ |
| 2. | සුජාතා විජේසිංහ මහත්මිය, | ✓ | ✓ | ✓ | ✓ |
| 3. | චින්තක එස්. ලොකුහෙට්ටි මහතා, | ✓ | **ab** | ✓ | - |
| 4. | කේ.ඩී.එන් රංජිත් අශෝක මහතා, | - | - | - | ✓ |
| 5. | ඩී. පීවාන්නන්ද මහතා, | ✓ | - | - | - |
| 6. | එස්.එල් නසීර් මහතා | - | ✓ | ✓ | ✓ |
| 7. | ඒ. ඩී.ඒ. කේ. නන්දසේන මහත්මිය , | **ab** | **ab** | ✓ | - |
| 8. | කේ.කේ.එස්.ඒ පෙරේරා මහතා, | - | - | - | ✓ |
| 9. | ඩී.එස්.එන්. හෙට්ටිගේ මහතා, | ✓ | ✓ | ✓ | - |
| 10. | ලලිත් පීරිස් මහතා, | ✓ | ✓ | ✓ | ✓ |
| 11. | එම්.එස්.එම්.රිස්මි මහතා | ✓ | ✓ | ✓ | ✓ |

### 1.7.1.2. අධ්‍යයන මණ්ඩලය

2001 අංක දරණ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීමේ පනතේ 03 කොටස 12 වන වගන්තිය අනුව ආයතනයේ අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

| | |
|---|---|
| පනතේ 16 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා | 01 |
| 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල නියෝජිතයෙක් | 01 |
| විභාග කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක් | 01 |
| සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් | 01 |
| අමාත්‍යවරයාගේ මතය අනුව, කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සහ පුහුණුව ලබා ඇත්තා වූ සමුපකාර අංශයෙන් හෝ පෞද්ගලික අංශයෙන් තෝරා ගනු ලබන තැනැත්තෙකු. | 01 |
| එකතුව | 05 |

පනතේ 12(03) උප වගන්තිය අධ්‍යයන මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම, වසර 03 කාලයක් සඳහා ආයතනයේ පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අධ්‍යයන මණ්ඩලය පත් කරනු ලබන අතර අධ්‍යයන මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූර්ණය සමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතයි.

#### ආයතනික අධ්‍යයන මණ්ඩලයේ කාර්යයන්

පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව කලමනාකරණ මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව ආයතනයේ අධ්‍යයන මණ්ඩලය විසින් පහත දැක්වෙන කර්තව්‍යය ඉටුකළ යුතුය.

(අ) ආයතනය සඳහා පුහුණු හා පර්යේෂණ වැඩ සටහන් සකස් කිරීම.

(ආ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සඳහා විෂයමාලා හා කරුණු සංවර්ධනය කිරීම.

(ඇ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන විභාග සඳහා නිර්දේශ පත්‍රිකා සකස් කිරීම සහ අනුමත කිරීම, විභාග අධීක්ෂණය කිරීම සහ ආයතනයේ අධ්‍යාපන පුහුණු වැඩසටහන් ඇගයීමට අදාළ යෝජනා ක්‍රම පිළියෙල කිරීම.

(ඈ) ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල ප්‍රතිඵල කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව නිකුත් කිරීම සහ,

(ඉ) ශිෂ්‍යත්ව, නිල ලාංඡන සහ වෙනත් ප්‍රදානයන් ප්‍රදානය කිරීමට අදාළ විය යුතු කොන්දේසි නියම කිරීම.

සමාලෝචිත වසර තුළ අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

| නම | තනතුර |
|---|---|
| **සුජාතා විජේසිංහ මහත්මිය,** | අධ්‍යයන මණ්ඩල සභාපති,<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,<br>පොල්ගොල්ල<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය) |
| **ඩබ්.එම්. එන්. ජේ. පුෂ්පකුමාර මහතා** | අධ්‍යයන මණ්ඩල සාමාජික,<br>විභාග කොමසාරිස් ජනරාල්,<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>පැලවත්ත, බත්තරමුල්ල. |
| **පත්කර නොමැත** | අධ්‍යයන මණ්ඩල සාමාජික,<br>විශ්ව විද්‍යාල කොමිෂන් සභා නියෝජිත,<br>ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය,<br>ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය,<br>පේරාදෙණිය විශ්ව විද්‍යාලය, |
| **පත්කර නොමැත** | අධ්‍යයන මණ්ඩල සාමාජික,<br>සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ නියෝජිත,<br>සමුපකාර සංවර්ධන කොමසාරිස්, මධ්‍යම පළාත,<br>සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>ඇහැලේපොල කුමාරිහාමි මාවත, බෝගම්බර,<br>මහනුවර. |
| **සී.සී හිඳැල්ලආරච්චි මහතා** | අධ්‍යයන මණ්ඩල සාමාජික,<br>විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශිත සාමාජික, |

## අධ්‍යයන මණ්ඩල රැස්වීම් සමාලෝචිතය

සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන පාඨමාලා ප්‍රතිඵල නිකුත් කිරීම හා සෙසු කාර්යයන් සඳහා

| නම | සහභාගිත්වය |
|---|---|
| | 2017.03.30 |
| සුජාතා විජේසිංහ මහත්මිය, | ✓ |
| ඩබ්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර මහතා | ✓ |
| සී.සී හිඳැල්ලආරච්චි මහතා | ✓ |

✓ - අධ්‍යයන මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිත්වය   ab - අධ්‍යයන මණ්ඩල රැස්වීම් සඳහා නොපැමිණීම   - - අධ්‍යයන මණ්ඩල සාමාජිකත්වය නොමැත

#### 1.7.1.3. විගණන හා කළමණාකරණ කමිටුව.

යහපාලන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව යමින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2010.12.14 දිනැති චක්‍රලේඛ අංක PED/55 මගින් පෙන්වා දී ඇති පරිදි ආයතනික කටයුතු සම්බන්ධව විගණන හා කළමනාකරණ කමිටුව ආයතනික කළමනාකරණ මණ්ඩලය විසින් පත්කර ඇත. මෙම කමිටුව කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විතව ඇත.

**විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් සමාලෝචිතය**

මෙම වසරට අදාලව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පවත්වා ඇත. අදාල රැස්වීම් සඳහා සහභාගීත්වය පහත පරිදිය.

| නම | සහභාගිත්වය | | | |
|---|---|---|---|---|
| | 2017.03.14 | 2017.06.09 | 2017.10.27 | 2018.01.12 |
| ඒ.ඩී.ඒ.කේ.නන්දසේන මහත්මිය<br>කමිටු සභාපති,<br>කළමනාකරණ මණ්ඩල සාමාජික | ✓ | ✓ | - | - |
| කේ.කේ.එස්.ඒ පෙරේරා මහතා,<br>කමිටු සභාපති,<br>කළමනාකරණ මණ්ඩල සාමාජික | - | - | ✓ | ✓ |
| ඩී.එස්.එන්.හෙට්ටිගේ මහතා<br>කමිටු සාමාජික,<br>කළමනාකරණ මණ්ඩල සාමාජික | ab | ✓ | ✓ | |
| පි.ආර්.කේ.එස් ගනේගොඩ මහතා<br>කමිටු සාමාජික,<br>කළමනාකරණ මණ්ඩල සාමාජික | - | - | - | ✓ |
| ඒ.එන්.එන්. පෙරේරා මහත්මිය<br>රජයේ විගණන අධිකාරී. | ✓ | ✓ | ✓ | ✓ |
| බි.කේ.එම්.ජේ.රුද්‍රිගු මහත්මිය<br>ප්‍රධාන අභ්‍යන්තර විගණක,<br>අමාත්‍යාංශය | - | - | ✓ | ✓ |
| එම්.එස්.එම්.රිස්මි මහතා<br>කමිටු සාමාජික,<br>කළමනාකරණ මණ්ඩල සාමාජික | ✓ | ✓ | ✓ | ✓ |

✓ - රැස්වීම් සඳහා සහභාගිත්වය ab - රැස්වීම් සඳහා නොපැමිණීම - සාමාජිකත්වය නොමැත

#### 1.7.1.4. ආයතනයේ කාර්ය මණ්ඩලය

ආයතනික පනතේ 04 වන කොටස 16(1) උප වගන්තිය අනුව කලමනාකරණ මණ්ඩලය විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වන්නේය. අධ්‍යක්ෂ ජනරාල් යටතේ ලේඛකාධිකාරි ප්‍රමුඛ පරිපාලන කටයුතු ආයතන හා පරිපාලන, මුල්‍ය, නේවාසික, මුද්‍රණ, ශ්‍රව්‍ය දෘෂ්‍ය යන අංශ ඔස්සේ කළමනාකරණය කෙරේ.

ආයතනික අධ්‍යයන අංශය අධ්‍යක්ෂක (අධ්‍යයන හා සංවර්ධන)ගේ මඟ පෙන්වීම යටතේ කටයුතු කරන අතර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය, ජ්‍යෙෂ්ඨ පර්යේෂක, පර්යේෂක, ජ්‍යෙෂ්ඨ පුස්තකාලාධිපති හා පුස්තකාලාධිපති තනතුරු සහ පරිගණක අංශයේ උපදේශක කාර්ය මණ්ඩලය අධ්‍යයන අංශය ශක්තිමත් කරයි.

පිරිස් බල තක්සේරුවක් මගින් ආයතනික අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි තනතුරු 71 ක් හදුනාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවෙන් අනුමැතිය ලබා ගෙන ඇත. අනුමත කාර්ය මණ්ඩල තොරතුරු පහත පරිදි වේ.

| තනතුරු කාණ්ඩය | වැටුප් කේතය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකාර | HM 2-1 | අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාර | HM 1-1 | ලේඛකාධිකාරී | 01 |
| | | අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) | 01 |
| ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ | AR – 2 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 04 |
| | | ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති | 01 |
| | | ජ්‍යෙෂ්ඨ පර්යේෂක | 01 |
| අධ්‍යයන හා පර්යේෂණ | AR – 1 | කථිකාචාර්ය/ සහකාර කථිකාචාර්ය | 08 |
| | | පුස්තකාලයාධිපති/සහකාර පුස්තකාලයාධිපති | 01 |
| | | පර්යේෂක/සහකාර පර්යේෂක | 01 |
| කළමනාකරණ | MM 1-2 | සහකාර ලේඛකාධිකාරී | 01 |
| | | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | 01 |
| | | අභ්‍යන්තර විගණක | 01 |
| | | සහකාර අධ්‍යක්ෂ (නේවාසිකාගාර) | 01 |
| කණිෂ්ඨ මට්ටමේ කළමනාකරුවන් | JM 1-1 | ගිණුම් නිලධාරී | 02 |
| | | පරිපාලන නිලධාරී (විභාග) | 01 |
| | | පරිපාලන නිලධාරී (පරිපාලන/මානව සම්පත්) | 01 |
| | | පරිපාලන නිලධාරී (ශිෂ්‍ය කටයුතු) | 01 |
| | | ප්‍රසම්පාදන හා නඩත්තු නිලධාරී | 01 |
| | | අලෙවි ප්‍රවර්ධන හා මුද්‍රණ නිලධාරී | 01 |
| | | ප්‍රවාහන නිලධාරී | 01 |
| | | ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටන් නිලධාරී | 01 |
| | | නේවාසිකාගාරභාර නිලධාරී | 01 |
| බලාත්කම කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරීන් | MA 5-3 | පරිගණක වැඩසටහන් සම්පාදක | 01 |
| ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරීන් | MA 4 | පරිගණක උපදේශක | 03 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | MA 2-1 | ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ සහකාර | 01 |
| | | මුද්‍රණ යන්ත්‍ර තාක්ෂණ සහකාර | 01 |
| | | පද්ධති ක්‍රියාකරු | 01 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-1 | කළමනාකරණ සහකාර | 10 |
| ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය | PL – 3 | රියදුරු | 06 |
| ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ ශිල්පීය | PL – 2 | සංචාරක බංගලා භාරකරු | 01 |
| ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන | PL – 1 | කාර්යාල සහායක | 14 |
| **එකතුව** | | | **71** |

ආයතනික අනුමත කාර්ය මණ්ඩලය 71 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට ආයතනය තුල නියුක්ත සේවක සංඛ්‍යාව 33 ක් විය. එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 38 කි.

ආයතනයේ මෙම කාර්ය මණ්ඩලයට අමතරව රේඛීය අමාත්‍යාංශයට බඳවා ගන්නා ලද සංවර්ධන නිළධාරීනියන් හත් දෙනෙකු මෙම ආයතනය වෙත 2015 මැයි මස සිට අනුයුක්ත කර ඇති අතර ඔවුන් ද ආයතනික කටයුතු සඳහා විශාල දායකත්වයක් ලබාදේ.

**2017.12.31 දිනට අනුමත තනතුරු හා සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු**

| අනු අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | 00 |
| 2. | ලේඛකාධිකාරි | 01 | 01 | 00 |
| 3. | අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) | 01 | 01 | 00 |
| 4. | ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය | 04 | 03 | 01 |
| 5. | ජ්‍යේෂ්ඨ පුස්තකාලයාධිපති/ පුස්තකාලයාධිපති | 01 | 01 | 0 |
| 6. | ජ්‍යේෂ්ඨ පර්යේෂක | 01 | 01 | 00 |
| 7. | කථිකාචාර්ය | 04 | 0 | 04 |
| 8. | සහකාර කථිකාචාර්ය | 04 | 03 | 01 |
| 9. | සහකාර පුස්තකාලයාධිපති | 01 | 01 | 0 |
| 10. | සහකාර පර්යේෂක | 01 | 01 | 00 |
| 11. | සහකාර අධ්‍යක්ෂ (නේවාසිකාගාර) | 01 | 00 | 01 |
| 12. | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 01 | 01 | 0 |
| 13. | සහකාර ලේඛකාධිකාරි | 01 | 01 | 0 |
| 14. | අභ්‍යන්තර විගණක | 01 | 01 | 00 |
| 15. | ගිණුම් නිලධාරි | 02 | 01 | 01 |
| 16. | පරිපාලන නිලධාරි (විභාග) | 01 | 0 | 01 |
| 17. | පරිපාලන නිලධාරි (පරිපාලන/ මානව සම්පත්) | 01 | 01 | 0 |
| 18. | ප්‍රසම්පාදන හා නඩත්තු නිලධාරි | 01 | 01 | 00 |
| 19. | ප්‍රවාහන නිලධාරි | 01 | 0 | 01 |
| 20. | පරිපාලන නිලධාරි (ශිෂ්‍ය කටයුතු) | 01 | 01 | 0 |
| 21. | අලෙවි ප්‍රවර්ධන හා මුද්‍රණ නිලධාරි | 01 | 01 | 00 |
| 22. | ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් නිලධාරි | 01 | 00 | 01 |
| 23. | නේවාසිකාගාර භාර නිලධාරි | 01 | 00 | 01 |
| 24. | පරිගණක වැඩසටහන් ප්‍රක්‍රමණකරු | 01 | 01 | 0 |
| 25. | ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ සහායක | 01 | 01 | 0 |
| 26. | මුද්‍රණ යන්ත්‍ර තාක්ෂණ සහායක | 01 | 01 | 0 |
| 27. | පද්ධති ක්‍රියාකරු | 01 | 00 | 01 |
| 28. | කළමනාකරණ සහකාර | 10 | 02 | 08 |
| 29. | පරිගණක උපදේශක | 03 | 01 | 02 |
| 30. | රියදුරු/කාර්යාල සහයක | 06 | 04 | 02 |
| 31. | සංචාරක බංගලා භාරකරු | 01 | 01 | 0 |
| 32. | කාර්යාල සහයක | 14 | 06 | 08 |
| | **එකතුව** | **71** | **38** | **33** |
| 33. | *සහකාර නේවාසික කළමණාකරු | | 01 | 0 |
| | **මුළු එකතුව** | | **39** | |

***තනතුර පෞද්ගලික වන සේ පිහිටුවා ඇත.**

මානව සම්පත් සංවර්ධනය ආයතනික කාර්ය මණ්ඩල පුහුණු කිරීම් යටතේ 2017 වසර තුල දේශීය විදේශීය පුහුණු වැඩසටහන් වෙනුවෙන් කාර්ය මණ්ඩලය යොමුකර ඇත.

### 1.7.2. ආයතනික භෞතික සම්පත්

ආයතනික භෞතික සම්පත් අක්කර 21 කට ආසන්න සමස්ථ භූමිභාගය තුළ පිහිටා ඇති අතර එය භාවිතයේ හා ආදායම් උත්පාදන මූලාශ්‍ර ස්වරූපය අනුව පහත පරිදි උප ක්ෂේත්‍ර ගත කළ හැක.

- කාර්යාල පරිශ්‍රය
- දේශන ශාලා
- සම්මන්ත්‍රණ ශාලා
- නේවාසික පහසුකම්
- වෙනත් භෞතික හා ප්‍රාග්ධන සම්පත්

#### 1.7.2.1. කාර්යාල පරිශ්‍රය

ආයතනික ප්‍රධාන පරිපාලන ඒකකය සහිත කාර්යාල පරිශ්‍රය ගොඩනැගිලි 3 කින් සමන්විතය.ආයතනික සමස්ත පරිපාලන කටයුතු මෙහෙය වන අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය හා විභාග අංශය ස්ථාපිත ගොඩනැගිල්ල මහල් දෙකකින් යුත් වර්ග අඩි 1200 සහිත ගොඩනැගිල්ලක පිහිටුවා ඇත.

පරිපාලන, මූල්‍ය හා අධ්‍යයන අංශයද අධ්‍යයන කාර්යය මණ්ඩලයේ රාජකාරී නිල කාමරද ඇතුලත් පරිශ්‍රය ප්‍රධාන මෙහෙයුම් පරිශ්‍රය වර්ග අඩි 10,000 කට ආසන්නය.

පැරණි පරිපාලන ගොඩනැගිල්ල නේවාසිකාගර කර්යාලය,ලේඛණාගාරය, විභාග අංශයේ ලේඛණාගාරය, ප්‍රධාන තොග ගබඩාව, සමුපකාර කෞතුකාගාරය හා තවත් කාර්යාල කාමර කිහිපයකින් සමන්විතය. මෙම ගොඩනැගිල්ල තුල රජයේ විගණන අංශය ස්තාපිත කර ඇති අතර ඒ වෙනුවෙන් කාමර 03 ක් වෙන් කර දී ඇත.

#### 1.7.2.2. දේශන ශාලා




ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යයන කටයුතු සඳහා ආයතනික ප්‍රධාන පරිශ්‍රය තුළ යොදාගත හැකි දේශන ශාලා රැසක් පවතී.

**B ශාලාව**

ආයතනයේ ඓතිහාසික වටිනාකමක් සහිත සුව පහසු ආසන 100 කින් සමන්විත ශාලාව ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් වලින් යුක්තය.

**රොච්ඩේල් ශාලාව**

ආසන 100 කින් සමන්විත ශාලාව ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් සහිත මෙම දේශන ශාලාව ඉතා නිදහස් පරිසරයක අධ්‍යයන කටයුතු වල යෙදීමට අපේක්ෂිත විද්‍යාර්ථීන්ගේ විශේෂ ඉල්ලුමක් සහිත ශාලාවකි.

**C 1 , C2 හා C3 දේශන ශාලා**



වායුසමනය කළ නවීන අධ්‍යයන ආසන යොදා නවීකරණය කර ඇති මෙම දේශන ශාලා කුඩා කණ්ඩායම් දේශන කටයුතු සඳහා වඩාත් යෝග්‍ය වේ. C -1ශාලාවේ ආසන 40 ක් හා C -2ශාලාවේ ආසන 40 ක් ද C -3ශාලාවේ ආසන 30 ක් බැගින් ආසන 110 ක් ඇති අතර ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් හා අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් පහසුකම් වලින් යුක්තය.

**බහු කාර්ය ගොඩනැගිල්ල**

නව තොරතුරු තාක්ෂණ ඒකකය සහිත වෘත්තීය අධ්‍යාපන අංශය ස්ථාපිත කර ඇති බහු කාර්ය ගොඩනැගිල්ල තුල කුඩා ප්‍රමාණයේ සම්මන්ත්‍රණ ශාලාවක් ද ඇතුලත් ව දේශන ශාලා පහක් ස්ථාන ගත කර ඇති අතර එම සියලුම දේශන ශාලා ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් ඇතුලත්ව මූලික අධ්‍යයන උපකරණ වලින් සමන්විත අතර සුව පහසු නවීන අධ්‍යයන ආසන වලින් යුක්තය.





මෙම ගොඩනැගිල්ලෙහි පවත්නා තොරතුරු තාක්ෂණ ඒකකයේ විද්‍යාගාර දෙක තුල නවතම මාදිලියේ පරිගණක 66 ක් අධ්‍යයන කටයුතු සඳහා වෙන්කර ඇත.

මෙම ඒකකය තුල දේශන ශාලා අංක 01හි ශිෂ්‍යයන් 45 ක් සඳහා ද දේශන ශාලා අංක 02 ,හි ශිෂ්‍යයන් 80 ක් සඳහා ද, දේශන ශාලා අංක 03හි ශිෂ්‍යයන් 50ක් ද,දේශන ශාලා අංක 04 හි ශිෂ්‍යයන් 45 ක් සඳහා හා කුඩා ශ්‍රවනාගාරයේ ශිෂ්‍යයන් 80 ක් ද වශයෙන් සම්පූර්ණයෙන් විද්‍යාර්ථයින් 300 ක් වෙනුවෙන් උසස් තත්ත්වයේ පහසුකම් සපයයි.


ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සියලුම දේශණ ශාලා එකවර පුහුණුලාභීන් 430 ක් සඳහා අධ්‍යයන කටයුතු සඳහා සපයන අතර මෙම දේශන ශාලා වලට අමතරව සම්මන්ත්‍රණ ශාලා පහසුකම් ද අධ්‍යයන හා වෙනත් සැසි සඳහා ගොඩනගා ඇත.


### 1.7.2.3. සම්මන්ත්‍රණ ශාලා

**ජාතික සමුපකාර සංවර්ධන අයතනික ශ්‍රවනාගාරය**

සමුපකාර හා වෙනත් ආයතනයන් හි විවිධ අවශ්‍යතා පරිදි පුහුණු හා සම්මන්ත්‍රණ පැවැත්වීමට අවශ්‍ය භෞතික ඉඩපහසුකම් සැපයීම, ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා සමුළු පැවැත්වීම,ජාතික හා ජාත්‍යන්තර ප්‍රසාංගික අත්දැකීම් සඳහා පහසුකම් සැපීම හා ආයතනික ආදායම් උත්පාදනය යන අරමුණු ඔස්සේ අගනුවරින් බැහැරව ඉදිකල විශිෂ්ඨතම බහුකාර්ය ශ්‍රවනාගාරය ජාතික සමුපකාර සංවර්ධන ආයතනික ශ්‍රවනාගාරයයි,







බැල්කනිය සහිත ප්‍රධාන ශ්‍රවනාගාරය තුල ආසන 1168 කින් යුක්ත අතර සම්පූර්ණයෙන්ම වායුසමනය කර ඇති මෙම ශ්‍රවනාගාරයේ ඉඩකඩ පහත පරිදි වෙයි.

| විස්තරය | ඉඩ ප්‍රමාණය |
|---|---|
| සම්පූර්ණ ගොඩනැල්ලේ වර්ගඵලය | 3723.63 වර්ගමීටර |
| ප්‍රධාන ශ්‍රවනාගාරය (බැල්කනිය හා පහත මාලය) | 1505.5 වර්ගමීටර |
| ප්‍රධාන වේදිකාව | 259 වර්ගමීටර |
| ශ්‍රවනාගාරය ආසන සංඛ්‍යාව | 1118 (711+407) |

| | |
|---|---|
| අමුත්තන්ගේ විවේක ඉඩකඩ | 1000 වර්ගමීටර |
| කාර්යාල ඉඩකඩ | 240 වර්ගමීටර |
| දේශන ශාලා හා සෙසු කලාකරුවන් සඳහා වූ ඉඩකඩ | 719.13 වර්ගමීටර |

විදුලි ආලෝකකරණ පහසුකම් හා ශබ්ද පරිපාලන පහසුකම් හා භෝජනාගාර පහසුකම මෙන්ම වාහන 300 ක් පමණ ගාල්කිරීමේ රථ ගාලකින් යුත් මෙම ශ්‍රවනාගාරයේ 2017 වර්ෂය තුල පහත ගාස්තු ක්‍රමය ඔස්සේ වැඩසටහන් පවත්වා රුපියල් මිලියන 4.68 ක මුදලක් උපයා ඇත.

| ආයතනික අංශය | වැඩසටහනේ ස්වරූපය | |
|---|---|---|
| | ප්‍රාසාංගික (පැය 06) | ප්‍රාසාංගික නොවන (පැය 06) |
| රාජ්‍ය හා සමුපකාරික ආයතන | රු. 225,000.00 | රු. 225,000.00 |
| පෞද්ගලික අංශය | රු. 300,000.00 | රු. 250,000.00 (දිවා) |
| | | රු. 275,000.00 (රාත්‍රී) |
| අතිරේක පැය 01 ක් සඳහා මූලික ගාස්තුවෙන් 15% ක් අමතරව අයකෙරෙන අතර පෙරහුරු කටයුතු වෙනුවෙන් පැය 02 ක් වෙනුවෙන් රු.75,000.00 මුදලක් අයකරනු ලැබේ. | | |

### රත්නායක ශාලාව



සම්මන්ත්‍රණ හා සමුළු පැවැත්වීම සඳහා යෝග්‍ය වන පරිදි ආසන 55 කින් යුත් මෙම ශාලාව බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ, ශබ්ද විකාශන පද්ධතියකින් සමන්විත වායු සමීකරණය කරන ලද ශාලාවකි.

සමාලෝචිත වසර තුල රු.මි 9.7 මුදලක් වැයකර මෙම ශාලාව හා නේවාසිකාගාරය ද ඇතුලත්ව සම්පූර්ණයෙන් නවීකරණ කටයුතු අවසන් කරනු ලැබ ඇත.


### නව රොච්ඩේල් ශාලාව



ආසන 80 කින් සමන්විත කණ්ඩායම් ක්‍රියාකාරකම් සහිත අධ්‍යයන හා පුහුණු සැසි සඳහා වඩාත් උචිත වන පරිදි වායුසමනය කළ මෙම ශාලාව බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ, ශබ්ද විකාශන පද්ධතියකින් සමන්විත වේ.

### වින්සන්ට් සුභසිංහ ශාලාව

නවීන ශබ්ද පරිපාලන පද්ධතියක් සහිත වේදිකා නාට්‍ය හා චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ පහසුකම්ද ඇතුළුව අනෙකුත් කාර්යයන් සඳහාද පහසුකම් සහිතව ආසන 600 කින් යුත් මෙම කුඩා ශ්‍රවනාගාරය ප්‍රදේශයේ ශ්‍රවනාගාර අවශ්‍යතාවයන් තෘප්තිමත් කරයි.



අවම ගාස්තු ක්‍රමයක් යටතේ බාහිර ආයතන වෙත මෙම ශාලාව වෙන්කරගැනීමට පහසුකම් සලසා ඇත්තේ ආයතනික සමාජයීය වගකීම ඉටුකිරීමේ අභිලාශයෙනි.

සමස්ථයක් වශයෙන් ගත්කල අධ්‍යයන කටයුතු සිදු කිරීම නවීන ශ්‍රව්‍ය දෘෂ්‍ය පහසුකම්වලින් සමන්විත දේශන ශාලා හා සම්මන්ත්‍රණශාලා 14 ක් ආයතනය සතු වන අතර ඒවායේ මුළු ධාරිතාවය ආසන 2,218 කි. ශ්‍රවනාගාරය හැර එම අගය 1100 ක් පමණි, විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | | ශාලාව | ආසන සංඛ්‍යාව |
|---|---|---|---|
| I. | දේශන ශාලා | නව රොච්ඩේල් ශාලාව | 60 |
| II. | | B ශාලාව | 80 |
| III. | | රොච්ඩෙල් ශාලාව | 60 |
| IV. | | C1 දේශනශාලාව | 40 |
| V. | | C2දේශන ශාලාව | 40 |
| VI. | | C3 දේශන ශාලාව | 20 |
| VII. | | බහුකාර්ය ගොඩනැගිල්ල දේශන ශාලා අංක - 01 | 70 |
| VIII. | | බහුකාර්ය ගොඩනැගිල්ල දේශන ශාලා අංක - 02 | 45 |
| IX. | | බහුකාර්ය ගොඩනැගිල්ල දේශන ශාලා අංක - 03 | 40 |
| X. | | බහුකාර්ය ගොඩනැගිල්ල දේශන ශාලා අංක - 04 | 65 |
| XI. | සම්මන්ත්‍රණ ශාලා | NICD ශ්‍රවණාගාරය | 1,118 |
| XII. | | වින්සන්ට් සුභසිංහ ශාලාව | 450 |
| XIII. | | රත්නායක ශාලාව | 55 |
| XIV. | | බහුකාර්ය ගොඩනැගිල්ල සම්මන්ත්‍රණ ශාලාව | 75 |
| | | **එකතුව** | **2,218** |

### 1.7.2.4. නේවාසික පහසුකම්

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය නේවාසික පුහුණු ආයතනයක් වශයෙන් අධ්‍යයන කාර්යයේදී දිවයින පුරා විසිරි සිටින විද්‍යාර්ථීන් වෙනුවෙන් නේවාසික අධ්‍යාපන අවස්ථාව හිමිකර දී ඇති නේවාසික පහසුකම් කාණ්ඩ කිහිපයක් යටතේ ගොඩනගා ඇත.

නේවාසිකාගාර පද්ධතිය මෙම ආයතනයේ ප්‍රධාන වත්කමක් හා ඓතිහාසික සංකේතයක් ද වන්නේය. 2016 හා 2017 වාර්ෂික භාණ්ඩාගාර ප්‍රතිපාදන ඔස්සේ රු.මි 40 කට ආසන්න මුදලක් වැයකර ශිෂ්‍ය නේවාසිකාගාර D,E,F,G,H ද රත්නායක හා නව රත්නායක වාණිජමය නේවාසිකාගාර ද සම්පූර්ණයෙන් නවීකරණය කරනු ලැබ ඇත.

**ශිෂ්‍ය නේවාසිකාගාර**

එක් මහලක කාමර 10 බැගින් හා පොදු නාන කාමර පද්ධති 02 බැගින් වූ මහල් 2 කින් යුත් නේවාසිකාගාර 4 ක් සහිත ප්‍රධාන ශිෂ්‍ය නේවාසිකාගාර පද්ධතිය ආයතනයේ සංකේතයක් වන්නේය. මෙහි සෑම කාමරයකම නේවාසිකයින් දෙදෙනෙකු සඳහා තනි ඇඳන් 2 ක් හා අනෙකුත් පහසුකම් සහිතව ගොඩනගා ඇත.



සම්පූර්ණ නේවාසික ධාරිතාවය නේවාසිකයන් 160 ක් වන අතර ඉතා මනරම් හා නිදහස් පරිසරයක ස්ථාන ගත කර ඇත.

ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා අලුතින් එක් කරන ලද H නේවාසිකාගාරය පොදු නාන කාමර සහිත නේවාසික කාමර 04 කින් යුත් සම්පූර්ණ නේවාසික ධාරිතාවය 18 කි. සමස්ත නේවාසික ධාරිතාවය නේවාසිකයන් 178 ක් සඳහා වේ.



**වාණිජ නේවාසිකාගාර**

ශිෂ්‍ය නේවාසිකාගාරයට අයත් නොවන අනෙකුත් බාහිර පාර්ශවයන් වෙත නේවාසික පහසුකම් ලබා දීම සඳහා ගොඩනගා ඇති නේවාසිකාගාර පද්ධතිය නේවාසිකාගාර 4 කින් සමන්විත වේ.

**නව රත්නායක නේවාසිකාගාරය**

විශේෂ පුද්ගලයන් හා විදේශිය අධ්‍යයන කණ්ඩායම් ඉලක්ක ගත කර උණුවතුර පහසුකම් සහිත යාබඳ නාන කාමර වලින් යුත් වායුසමනය කළ නව රත්නායක නේවාසිකාගාරය තනි පුද්ගල කාමර 18 කින් හා ද්විත්ව කාමර 4 කින් සමන්විත වන අතර සමස්ත නේවාසික ධාරිතාවය 26 කි.

**රත්නායක නේවාසිකාගාරය**

උණුවතුර පහසුකම් සහිත නාන කාමර වලින් සමන්විත වායුසමනය කළ රත්නායක නේවාසිකාගාරය ද්විත්ව කාමර 14 කින් සමන්විත වන අතර සමස්ත නේවාසික ධාරිතාවය 26 කි.

**රත්නායක නිවාස**

පවුලක සමාජිකයන්, සමුපකාර සමිතියක, එක් ආයතනයක වැනි තනි කණ්ඩාමක් වශයෙන් නේවාසික පහසුකම් බලාපොරොත්තු වන පාර්ශවයන් ඉලක්ක කරගෙන ගොඩනගා ඇති මෙම නිවාස 2 ක යාබඳ නාන කාමර සහිත ත්‍රිත්ව කාමර 4 බැගින් ද මුලුතැන් ගෙයකින්ද යුක්තය.

**නිවාඩු නිකේතනය**



ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යාපනික වත්කම් වලට පරිබාහිර වූ සුවිශේෂි වත්කමකි, ආයතනය සතු නිවාඩු නිකේතනය.2014 වර්ෂයේ දී නවීකරණය කරන ලද මෙම නිවාඩු නිකේතනය තුල උණුවතුර පහසුකම සහිත යාබද නාන කාමර සහිතු ද්විත්ව කාමර 04 සහිතව පවුලේ නිවාඩුවකට ගැලපෙන කෑම කාමරය ආලින්දය හා සෙසු පහසුකම් සපයා ඇත.



නිහඬ පරිසරයක් තුල ඔබට අවශ්‍ය මුලික පහසුකම් සහිතව පූර්ණ ආරක්ෂාවක් සහිතව සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ නිවාඩු නිකේතනයේ පහසුකම් සලසා ඇත. නිවාඩු නිකේතනය වෙන්කරවා ගැනීම සෘජුව ආයතනය හරහා සිදුකර ගතහැක.

| **නේවාසිකාගාර කාණ්ඩය** | නේවාසිකාගාරයේ **නම** | **කාමර සංඛ්‍යාව** | **පහසුකම් සැපයිය හැකි නේවාසිකයින් සංඛ්‍යාව** |
|---|---|---|---|
| සාමාන්‍ය ශිෂ්‍ය නේවාසිකාගාර | 1. D නේවාසිකාගාරය | 20 | 40 |
| | 2. E නේවාසිකාගාරය | 20 | 40 |
| | 3. F නේවාසිකාගාරය | 20 | 40 |
| | 4. G නේවාසිකාගාරය | 20 | 40 |
| | 5. H නේවාසිකාගාරය | 06 | 18 |
| | | **86** | **178** |

| | | | |
|---|---|---|---|
| වාණිජ නේවාසිකාගාර | 6. නව රත්නායක නේවාසිකාගාරය.(වායු සමනිත) | 22 | 26 |
| | 7. ඒ. රත්නායක නේවාසිකාගාරය.(වායු සමනිත) | 14 | 26 |
| | 8. RHනිවාස 02 | 04 | 12 |
| | 9. නිවාඩු නිකේතනය | 04 | 08 |
| | | **44** | **72** |
| | **එකතුව** | **130** | **250** |

සාමාන්‍ය ශිෂ්‍ය නේවාසිකාගාර 05 කින් ද වාණිජ නේවාසිකාගාර 04 කින් යුත් නේවාසිකාගාර පද්ධතිය නේවාසිකාගාර 9 කින් සමන්විත වන අතර, එහි 250 දෙනෙකුට එකවර නවාතැන් පහසුකම් ලබා ගැනීමේ හැකියාව ඇත.

### 1.7.2.5. වෙනත් භෞතික හා ප්‍රාග්ධන සම්පත්

**තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය**



ජාතික සමුපකාර සංවර්ධන ආයතනික තොරතුරු තාක්ෂණ අංශය මධ්‍යම පලාත තුල පිහිටි රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ හොඳම පරිගණක මධ්‍යස්ථානයකි.

අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක පරිගණක ඒකකය සමුපකාර ක්ෂේත්‍රයේ විද්‍යාර්ථීන් ඉලක්ක කර පවත්වනු ලබන පාඨමාලාවන් වෙනුවෙන් වෙන්කර ඇති ප්‍රධාන පරිශ්‍රයේ පරිගණක මධ්‍යස්ථානයේ සමාලෝචිත වසරතුල පරිගණක 24 ක් වෙන්කර අධ්‍යයන අවස්ථාව ලබාදී ඇත.

පාසල් අධ්‍යාපනයේ නිරත හා පාසල් අධ්‍යාපනය අවසන් කර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට ප්‍රවිශ්ඨ වීමට අපේක්ෂාවෙන් උසස් පාඨමාලාවන් සොයන දරුවන් වෙනුවෙන් වූ පාඨමාලාවන් මෙහෙයවන හා වෘත්තීය පාඨමාලාවන්ගේ තොරතුරු තාක්ෂණ විෂයයන් ආවරණය කරනු ලබන පාඨමාලාවන් පවත්වනු ලබන බහුකාර්ය ගොබනැගිල්ලේ ස්ථාපිත තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේදී සමාලෝචිත වසරේදී පරිගණක 55 ශිෂ්‍ය ප්‍රයෝජනය වෙනුවෙන් යොදා තිබිණ.

නවීන අංගෝපාංගයන් ගෙන් යුතු පරිගණක අංශය විද්‍යාගාර 4 කින් සමන්විත වන අතර එහි පරිගණක 79 ක් ජාලගත කර අන්තර් ජාල පහසුකම් ද සපයා ශිෂ්‍ය අධ්‍යාපනයට ලබා දී ඇති අතර මෙම පරිගණක අංශය අංග සම්පූර්ණ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස පිළිගැනේ.

ආයතිනක පරිගණක ඒකකයේ ඇති සුවිශේෂී තත්වයක් වන්නේ බඳවාගනු ලබන සෑම ශිෂ්‍යයෙකුටම වෙන්කල පරිගණකයක් භාවිතා කිරීමට අවස්ථාව සලසා පාඨමාලා කාලයතුල අපේක්ෂිත නිපුනතාවය ලබාගන්නේ ද යන්න පූර්ණ අධීක්ෂණයක් පවත්වා ගැනීමයි.

**පුස්තකාල පහසුකම්**



ආයතනික පුස්තකාලය මෙරට සමුපකාර ක්ෂේත්‍රය සතු දියුණුම පුස්තකාලය ලෙස සැළකේ. විවිධ විෂයන් සඳහා ලියැවුණු ජාතික හා ජාත්‍යන්තර වැදගත්කමින් යුතු පොත් හා වාර සඟරා විසි එක් දහසක් පමණ මෙහි ඇත. තවද මෙහි සමුපකාර ක්ෂේත්‍රයට

සම්බන්ධ පොත් එකතුවක් වෙනම පවත්වාගෙන යනු ලබන අතර පුවත්පත් ලිපි/ සඟරා ලිපි එකතුවක් ද පවත්වාගෙන යනු ලබයි. පුස්තකාල සූචිය පරිගණක ගත කිරීම සිදු කරමින් පවතී. පුස්තකාල සේවාව සතු අන්තර්ජාල පහසුකම් ද පාඨකයන් සඳහා ප්‍රයෝජනයට ගත හැකිය.

**මුද්‍රණාල පහසුකම්**



ඕෆ්සෙට් මුද්‍රණය හා ඩුප්ලෝ මුද්‍රණය හැකියාවෙන් යුත් ආයතනික මුද්‍රණාලය ඒ සඳහා අවශ්‍ය වන්නා වූ සෙසු යන්ත්‍ර හා පහසුකම්වලින් වලින් යුතුව ගොඩනගා ඇති අතර එමගින් ආයතනික හා විද්‍යාර්ථීන්ගේ මුද්‍රණ අවශ්‍යතාවන් සපුරාලනු ලබයි. එසේම අනාගතයේදී රාජ්‍ය, සමුපකාර අංශයේ සහ පෞද්ගලික අංශයේ මුද්‍රණ සේවා සපයනු ලබන අංශයක් ලෙස ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

**ශ්‍රව්‍ය දෘෂ්‍ය පහසුකම්**



සමුපකාර විෂය පිළිබඳව පවත්වන විවිධ පාඨමාලා සහ බාහිර ආයතන මගින් පවත්වන වැඩසටහන් සඳහා අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් සැපයීම මෙම අංශය මගින් සිදු කෙරේ. දේශන ශාලා සඳහා ශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, මල්ටි මීඩියා යන්ත්‍ර, ශ්‍රව්‍ය උපකරණ ආදි තාක්ෂණ ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සලසා දෙනු ලබයි. තවද "වීඩියෝකරණය" යොදා ගනිමින් කෙරෙන "මයික්‍රෝ ටීචින්" තාක්ෂණ ක්‍රමය භාවිතයට පහසුකම් මෙම අංශයෙන් ලබා ගත හැකි අතර වීඩියෝ චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ පහසුකම් ද සළසා ගත හැක. සමුපකාර ක්ෂේත්‍රයට අදාලව පැවැත්වෙන විවිධ වැඩසටහන්වල සහ උත්සවවල විශේෂ අවස්ථා ඇතුලත් ඡායාරූප ගොනු එකතුවක් පවත්වාගෙන යාමද මෙම අංශයේ තවත් සේවාවකි.

**ප්‍රවාහන සේවය**

ආයතනික අභ්‍යන්තර ප්‍රවාහන කටයුතු සඳහා යොදාගනු ලබන වෙන්කල වාහන 02 ට අමතරව සංචිත වාහන ඇනිය වෑන් රථයක්, බස් රථයක් හා ත්‍රීරෝද රථයකින් සමන්විතය. ආයතනික බස් රථය විද්‍යාර්ථීන් හා බාහිර පාර්ශවයන් වෙනුවෙන් ප්‍රවාහන පහසුකම් ලබා දෙන සම්පතකි.

# ආයතනික ප්‍රගතිය

## 2. ආයතනික ප්‍රගතිය

### 2.1. මුල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ පසුගිය වසර 5 ක කාල පරිච්ඡේදය සම්බන්ධව ආදායම්, වියදම්, භාණ්ඩාගාර ප්‍රදාන සංක්ෂිප්තව පහත පරිදි වේ.

#### 2.1.1. 2013 - 2017 වර්ෂික ආදායම

ජාතික සමුපකාර සංවර්ධන ආයතනික 2016 වර්ෂයේ වාර්ෂික සමස්ථ ආදායම රුපියල් මිලියන 36.66 ක් වූ අතර එම ආදායම අංශ අනුව පහත පරිදි දැක්විය හැක.

| විස්තරය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| පාඨමාලා ගාස්තු | 15,035,930 | 16,199,760 | 13,849,077 | 11,869,978 | 16,673,912.00 |
| නේවාසිකාගාර, දේශන ශාලා හා නිල නිවාස හා ගොඩනැගිලි කුලී | 11,659,899 | 13,485,724 | 17,237,382 | 9,462,940.00 | 10,090,323.00 |
| මහින්ද රාජපක්ෂ ශ්‍රවනාගායේ ආදායම | | | | 3,533,500.00 | 4,680,009.00 |
| ආහාර සැපයීම් මත කොමිස් හා සේවා ගාස්තු | 1,229,893 | 1,477,909 | 1,346,125 | 924,298 | 697,696.00 |
| මුද්‍රණ සේවා හා ප්‍රකාශන අලෙවි ගාස්තු | 460,110 | 271,715 | 34,036 | 11,737 | 109,870.00 |
| ස්ථාවර වත්කම් විකුණුම් ආදායම | 2,857,712 | 125,900 | 3,085,056 | 1,773,685 | 2,156,539.00 |
| වෙනත් ආදායම් | 5,418,299 | 2,331,964 | 573,732 | 1,913,006 | 1,776,016.00 |
| **මුළු ආදායම** | **36,661,843** | **33,892,972** | **36,125,408** | **29,489,144** | **36,184,365.00** |

#### 2.1.2. 2013- 2017 වාර්ෂික වියදම

| විස්තරය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| 1. වැටුප් හා වේතන, දේශන ගාස්තු, අනෙකුත් ගාස්තු | 24,849,379 | 26,981,094 | 29,798,644 | 32,875,799 | 32,912,050.00 |
| 2. ගමන් වියදම් | 1,367,759 | 1,551,703 | 808,791 | 499,670 | 347,155.00 |
| 3. සැපයුම් හා කාර්යාලීය අවශ්‍යතා | 6,515,097 | 6,337,853 | 6,743,328 | 3,856,367 | 4,498,298.00 |
| 4. නඩත්තු වියදම් | 4,620,868 | 5,067,118 | 3,478,885 | 856,605 | 981,193.00 |
| 5. ගිවිසුම්ගත සේවා | 17,244,015 | 18,184,056 | 18,719,614 | 19,259,345 | 19,108,120.00 |
| 6. අනෙකුත් | - | - | 2,515,438 | 1,623,121 | 1,918,204.00* |
| ආ) ජාතිය ගොඩනැගීමේ බදු | 278,897 | 304,108 | 100,319 | 127,598 | - |
| ඇ) විවිධ වියදම් | 2,395,020 | 2,096,237 | - | | - |
| ඈ) | 1,656,175 | 1,317,366 | 1,113,596 | 305,895 | - |
| **මුළු වියදම** | **58,927,210** | **61,839,535** | **63,280,630** | **59,404,400** | **59,765,020.00** |

* ජාතිය ගොඩනැගීමේ බදු හා ආයතනික අරමුදලට දායකත්වය ඇතුලත්ව

### 2.1.3. 2013 - 2017 කාලය තුල භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන

| විස්තරය | 2013 රු. | 2014 රු. | 2015 රු. | 2016 රු. | 2017 රු. |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රතිපාදන | 56,000,000 | 26,000,000 | 34,000,000 | 13,000,000 | 8,000,000 |
| පුනරාවර්තන ප්‍රතිපාදන | 25,066,462 | 25,425,571 | 27,054,900 | 29,217,750 | 30,978,448 |

### 2.1.4. 2013-2017 වර්ෂය තුල ආයතනික ඉපයීම්, වියදම් හා ප්‍රතිපාදන

| විස්තරය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| 1. ආයතනික ඉපයීම් | 36,661,843 | 33,892,972 | 36,125,408 | 29,489,144 | **36,184,365.00** |
| 2. වියදම | 58,927,210 | 61,839,535 | 62,064,700 | 59,404,400 | **59,765,020.00** |
| ප්‍රතිපාදනවලට පෙර ඌනතාවය | **(22,265,367)** | **(27,946,563)** | **(25,939,292)** | **(29,915,256)** | **(23,580,655.00)** |
| 3. පුනරාවර්තන ප්‍රතිපාදන(භාණ්ඩාගාර ප්‍රතිපාදන හා මහජන බැංකු ආධාර) | 25,227,101 | 27,448,017 | 28,673,025 | 30,192,750 | 30,978,448 |
| ප්‍රතිපාදනවලින් පසුව (ඌනතාවය) අතිරික්තය | 2,961,734 | (498,546) | 2,733,733 | 277,494 | 7,397,793 |

### 2.1.5. 2013-2017 වර්ෂය තුල ලද භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් හා යෙදවීම

| විස්තරය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය | **29,178,294** | **35,165,628** | 26,025,452 | 71,365,739 | 74,558,855 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් | 56,000,000 | 26,000,000 | 75,479,000 | 13,000,000 | 8,000,000 |
| සමුපකාර අරමුදලින් අත්තිකාරම් ලැබීම් | **20,000,000** | **25,000,000** | - | - | |
| **මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදන මුදල්** | **105,178,294** | **86,165,628** | **101,504,452** | **84,365,739** | **82,558,855** |
| **ප්‍රාග්ධන ප්‍රදාන යෙදවීම්** | | | | | |
| (අ) බහුකාර්ය ගොඩනැගිල්ල දෙවන අදියර හා අවසන් අදියර ඉදිකිරීම | 603,857 | - | - | - | - |
| (ආ) ජාතික වෘත්තීය ප්‍රමිත ලබාගැනීමේ වැඩසටහන | 2,461,448 | 647,944 | 98,713 | 3,505,660 | 1,787,944 |
| (ඇ)ශ්‍රවනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම | 66,947,364 | 59,492,229 | 30,040,000 | - | - |
| (ඉ)නේවාසිකාගාර නවීකරණය | | | | 6,301,224 | 32,988,585 |
| **මුළු වියදම** | **70,012,666** | **60,140,173** | **30,138,713** | **9,806,884** | **34,776,529** |
| **ඉදිරියට ගෙන ගිය ඉතිරි මුදල** | **35,165,625** | **26,025,455** | **71,365,739** | **74,558,855** | **47,782,329** |

## 2.2. අධ්‍යයන කටයුතු පිළිබඳ ප්‍රගතිය

### 2.2.1. ආයතනයේ අධ්‍යයන හා සංවර්ධන අංශය

ආයතනයේ ප්‍රමුඛ පරමාර්ථය වන සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය සඳහා වූ අධ්‍යාපනය හා පුහුණුව ලබාදීම අරමුණු කරගෙන ආයතනයේ අධ්‍යයන හා සංවර්ධන අංශය පහත පරිදි උප අංශ කිහිපයකින් තම අධ්‍යයන කටයුතු මෙහෙයවනු ලබයි.

I. සමුපකාර සංවර්ධන අධ්‍යයන අංශය
II. මානව සම්පත් සංවර්ධන අධ්‍යයන අංශය
III. පර්යේෂණ හා පුහුණු අංශය
IV. මුල්‍ය කළමනාකරණ හා සංවර්ධන අධ්‍යයන අංශය
V. ව්‍යාපාර කළමනාකරණ සංවර්ධන අධ්‍යයන අංශය
VI. තොරතුරු තාක්ෂණ අංශය

අධ්‍යයන හා සංවර්ධන අංශය අධ්‍යක්ෂ(අධ්‍යයන හා සංවර්ධන) යටතේ මෙහෙය වනු ලබන අතර ඉහත එක් එක් අංශ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු/කථිකාචාර්යවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. අතර මෙම ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුළත් කථිකාචාර්ය මහත්ම මහත්මීන් 06 දෙනෙකු ද අධ්‍යයන අවශ්‍යතාවය අනුව සම්බන්ධ කරගනු ලබන තම විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් බාහිර සම්පත්දායක සංචිතයක් ද මගින් අධ්‍යයන මානව සම්පත ශක්තිමත්ව ඇත.

සමුපකාර ක්ෂේත්‍රයේ හා අධ්‍යයන පර්යේෂණ පිළිබඳ හසල දැනුමක් සහිත කණ්ඩායමකගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන පුහුණු අවශ්‍යතා හඳුනාගැනීමේ වැඩසටහනක් මගින් තීරණය කරනු ලබන අන්තර්ගතයන් ඇතුලත්කර ආයතනික වාර්ෂික පුහුණු මාර්ගෝපදේශය ගෙඩනගනු ලැබේ. ඒ ඔස්සේ ආයතනික අධ්‍යයන මණ්ඩලයේ ද ආයතනයේ කථිකාචාර්ය මණ්ඩලයේ හා බාහිර සම්පත්දායකයින්ගේ සේවය ලබා ගනිමින් සෑම පාඨමාලාවකම ගුණාත්මකභාවය වර්ධනය කර පවත්වා ලනු ලැබේ.

ආයතනික පනතේ පළමු කොටසේ 4 වගන්තියේ උප වගන්ති (අ) සිට (ඒ) දක්වා වූ කර්තව්‍යයන් මගින් ඉලක්කගත කර ප්‍රමුඛතම කාර්යභාරය වනුයේ සමුපකාර ව්‍යාපාරයේ මානව සම්පත සංවර්ධනය කිරීමයි.

මෙම අරමුණ මුල් කොටගෙන සමාලෝචිත වසර තුල සමුපකාර අංශයට ප්‍රමුඛතාවය දෙමින් ශ්‍රී ලාංකේය මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා හා විෂයානු බද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් **64** ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් අතිරින් 05 ක් 2016 වසරතුල ආරම්භවූ ඒවා වූ අතර සෙසු වැඩසටහන් **59, 2017** වසර තුල ආරම්භව ක්‍රියාත්මක වූ ඒවා වේ.

## ආයතනය මගින් සංවිධානය කළ පාඨමාලා පිළිබඳ ප්‍රගතිය 2013 - 2017

| පාඨමාලා | | 2013 | | 2014 | | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පාඨමාලා සංඛ්‍යාව | සහභාගීත්වය | පාඨමාලා සංඛ්‍යාව | සහභාගීත්වය | පාඨමාලා සංඛ්‍යාව | සහභාගීත්වය | පාඨමාලා සංඛ්‍යාව | සහභාගීත්වය | පාඨමාලා සංඛ්‍යාව | සහභාගීත්වය |
| නිත්‍ය පුහුණු පාඨමාලා | සමුපකාර සංවර්ධන සහතික පත්‍ර | | | | | | | | | 02 | 85 |
| | සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා | | | | | | | | | 01 | 42 |
| සෙසු ඩිප්ලෝමා පාඨමාලා | සමුපකාරික වෘත්තීමය ඩිප්ලෝමා | 08 | 177 | 08 | 164 | 07 | 159 | 07 | 163 | 06 | 105 |
| | තොරතුරු තාක්ෂණ | | | | | | | | | 01 | 13 |
| | සමුපකාරික නොවන වෘත්තීමය | | | | | | | | | 01 | 26 |
| සෙසු සහතික පත්‍ර පාඨමාලා | සමුපකාරික වෘත්තීමය සහතිකපත් | | | | | | | | | 01 | 34 |
| | තොරතුරු තාක්ෂණ | 11 | 291 | 11 | 199 | 12 | 218 | 11 | 240 | 06 | 66 |
| | භාෂා | | | | | | | | | 02 | 24 |
| කෙටිකාලීන වැඩසටහන් | පුහුණු මාර්ගෝපදේශයේ ඇතුලත් | 41 | 1324 | 51 | 1879 | 19 | 666 | 22 | 711 | 19 | 547 |
| | පුහුණු මාර්ගෝපදේශයේ ඇතුලත් නොවූ | | | | | | | | | 04 | 169 |
| මහජන බැංකු ආධාර මත පුහුණු වැඩසටහන් | | | | 10 | 360 | 40 | 1548 | 04 | 237 | 6 | 230 |
| ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් | | | | | | | | | | 3 | 76 |
| වෘත්තීය විභාග සඳහා සිසුන් පුහුණු කිරීම | | 11 | 162 | 06 | 301 | 10 | 157 | 07 | 096 | 7 | 162 |
| ආයතනික සම්පත් උපයෝගී කරගෙන බාහිර ආයතන පැවැත්වූ පුහුණු වැඩසටහන් | | 421 | 24014 | 380 | 23475 | 712 | 36965 | 321 | 16955 | 979 | 22376 |
| **එකතුව ***| | **492** | **25968** | **466** | **26378** | **800** | **39713** | **372** | **18402** | **1038** | **23,955** |

### 2.2.2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරි පුහුණුව

ආයතනයේ මුඛ්‍ය කර්තව්‍යය වන්නේ සමුපකාර ක්ෂේත්‍රය යාවත්කාලීන වූ දැනුමින් පෝෂණය කොට සමුපකාර ක්ෂේත්‍රයේ ප්‍රගමනයට දායකත්වය දැක්වීමයි. ඒ අනුව සමුපකාර ක්ෂේත්‍රය වෙනුවෙන් වූ අනිවාර්ය පාඨමාලාවන් නිත්‍ය පුහුණු පාඨමාලා ගණයේ ලා සැලකේ.

ඒ අනුව මධ්‍යම රජයේ හා පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ වෘත්තීමය අවශ්‍යතා වෙනුවෙන් සැලැසුම්කර ඇති සමුපකාර සංවර්ධන සහතික පත්‍රපාඨමාලාව හා සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව ආයතනයේ නිත්‍ය පාඨමාලාවන්ය.

#### 2.2.2.1. සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වෙත බඳවාගනු ලබන සෑම නවක සමුපකාර සංවර්ධන නිළධාරියකු විසින්ම මෙම පාඨමාලාව සමුපකාර සමත්විය යුතු, පළමු කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම හා සේවය ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලෙස නිර්දේශිත පාඨමාලාව මෙයයි.

2016 වසර තුළ වයඹ පළාත් නිලධාරින් සඳහා සමුපකාර සංවර්ධන නිලධාරින් සඳහා ආරම්භකල පාඨමාලාවේ දෙවන වාරයේ අධ්‍යයන කටයුතු අවසන් කිරීම සහ සබරගමුව පළාත් සමුපකාර සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් නව සහතික පත්‍ර පාඨමාලාවක් ද දකුණ,බස්නාහිර හා ඌව පළාත් ඒකාබද්ධ කණ්ඩායම සඳහා නව සහතික පත්‍ර පාඨමාලාවක ද අධ්‍යයන කටයුතු 2017 දී ආරම්භ කරන ලදී.

ඌව පළාත් කණ්ඩායමේ ප්‍රතිඵල නිකුත්කිරීම 2017 වසරේ දී සිදු කරන ලදී.

| පාඨමාලාව | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව ( දකුණ,බස්නාහිර හා ඌව පළාත් ) | 2016.12.05 | 2018.4.10 | 53 |
| 2. සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (වයඹ පළාත- දෙවන වාරය) | 2016.03.08 | 2017.08.30 | 64 |
| 3. සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සබරගමුව පළාත- පළමු වාරය) | 2017.10.02 | 2018.02.09 | 32 |
| **එකතුව** | | | **149** |

මෙම ආයතනය මගින් පසුගිය පස් වසරතුල පවත්වන ලද සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | විස්තරය | |
|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව* | සහභාගි වූ මුළු සංඛ්‍යාව* |
| 2013 | 02 | 88 |
| 2014 | 01 | 52 |
| 2015 | 01 | 34 |
| 2016 | 02 | 120 |
| 2017 | 01 | 32 |

*** ඒ ඒ වර්ෂය තුල නව ලියාපදිංචි පාඨමාලා හා ශිෂ්‍ය සංඛ්‍යා පමණක් දැක්වේ.**

#### 2.2.2.2. සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වෙත බඳවා ගනු ලැබූ සේවයේ ස්ථිර කරන ලද, සේවා කාළය වසර පහක් සම්පූර්ණ වූ සමුපකාර සංවර්ධන නිලධාරින්ගේ දෙවන කඩඉම් පරීක්ෂණය ලෙස නිර්දේශිත පාඨමාලාව සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාවයි.

2017 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් බස්නාහිර, උතුරුමැද,නැගෙනහිර හා සබරගමුව පළාත් නියෝජනය කල 42 දෙදෙනෙකු වෙනුවෙන් නව සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කරන ලදී.

| පාඨමාලාව | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව (බස්නාහිර,උතුරුමැද,නැගෙනහිර හා සබරගමුව පළාත) | 2017.05.22 | 2017.11.22 | 42 |

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරීන් සඳහා පසුගිය පස් වසරක කාලය තුල පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලා හා පුහුණුලාභීන් සංඛ්‍යාව පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ. මෙම පාඨමාලාවන් සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව මධ්‍යම රජයේ හා පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වෙත කරනු ලබන බඳවා ගැනීම් මත රදා පවතී.

| වර්ෂය | පාඨමාලා සංඛ්‍යාව* | සහභාගී වූ මුළු සංඛ්‍යාව* |
|---|---|---|
| 2013 | 01 | 40 |
| 2014 | 01 | 29 |
| 2015 | 01 | 40 |
| 2016 | නව ලියාපදිංචි නැත | |
| 2017 | 01 | 42 |
| **මුළු සංඛ්‍යාව** | **04** | **151** |

*ඒ ඒ වර්ෂය තුල නව ලියාපදිංචි පාඨමාලා හා ශිෂ්‍ය සංඛ්‍යා පමණක් දැක්වේ.

### 2.2.3. ඩිප්ලෝමා පාඨමාලා

ආයතනය විසින් සමුපකාර ක්ෂේත්‍රය ප්‍රමුඛ කරගනිමින් හඳුනාගත් වෙනත් ක්ෂේත්‍ර වෙත ද අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පුළුල් කිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව වර්තමානයේ දී පහත ක්ෂේත්‍ර ආවරණය කෙරෙන සේ ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලබයි.

- සමුපකාරික වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා
- තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා
- සමුපකාරික නොවන වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා

#### 2.2.3.1. සමුපකාරික වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා


මෙම පාඨමාලා සමුපකාර ව්‍යාපාරයේ වෘත්තිකයන් එනම් සමුපකාර සමිති කාර්ය මණ්ඩලය හා සභාපතිවරු ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය මෙන්ම සේවකයන්ගේ දැනුම හා කුසලතාවය වැඩි දියුණු කිරීම සඳහා සැලසුම්කර ඒ ඒ ක්ෂේත්‍රය ඔස්සේ පවත්වනු ලබන එක් අවුරුදු අර්ධ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවන් වේ.

2017 වසර තුල ඩිප්ලෝමා පාඨමාලා 06 ක් ආරම්භ කරන ලද අතර එමගින් සිසුන් 105 දෙනෙක් වෙනුවෙන් අවශ්‍ය දැනුම හා පුහුණුව ලබා දෙන ලදී.

2017 වර්ෂයේදී ආරම්භ කරන ලද ඩිප්ලෝමා පාඨමාලාවල විස්තර පහත පරිදි වේ.

| පුහුණු පාඨමාලාව | ආරම්භක දිනය | අවසන් කිරීමට නියමිත දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | 2017.03.21 | 2018.03.21 | **19** |
| මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | 2017.03.28 | 2018.03.28 | **23** |
| විගණන ඩිප්ලෝමා පාඨමාලාව | 2017.03.27 | 2018.03.27 | **23** |
| ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2017.04.03 | 2018.04.03 | **14** |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2017.04.03 | 2018.04.03 | **15** |
| සුළුමූල්‍යකරණ ඩිප්ලෝමා පාඨමාලාව | 2017.04.03 | 2018.04.03 | **11** |
| **එකතුව** | | | **105** |

2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ පස් අවුරුදු කාලය තුල මෙම ආයතනය මගින් පවත්වන ලද සමුපකාර වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව හා පුහුණුලාභීන් සංඛ්‍යාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.




| වර්ෂය | පාඨමාලා සංඛ්‍යාව* | සහභාගි වු මුළු සංඛ්‍යාව* |
|---|---|---|
| 2013 | 6 | 119 |
| 2014 | 6 | 110 |
| 2015 | 6 | 106 |
| 2016 | 5 | 101 |
| 2017 | 6 | 105 |
| **මුළු සංඛ්‍යාව** | **29** | **541** |

### 2.2.3.2. තොරතුරු තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව



මෙම පාඨමාලාව පාසැල් අධ්‍යාපනය අවසන් කර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙන් උසස් අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන තරුණ තරුණියන් වෙනුවෙන් නූතන පරිගණක භාෂා තුනක් ද ඇතුලත්කර සැලසුම් කරන ලද සය මාසික පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවකි.

සෑම වසරකම අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උ.පෙ) අවසන් වූ පසු ආරම්භ කෙරෙන මෙම පාඨමාලාවට 2017 වසරේ දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් 13 දෙනෙකු ඇතුලත් කරගන්නා ලදී.

| පාඨමාලාවේ නම | ආරම්භක දිනය | අවසන්කළ/අවසන් කිරීමට නියමිත දිනය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව | 2017.09.25 | 2018.03.25 | 13 |

2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ පස් අවුරුදු කාලය තුල මෙම ආයතනය මගින් පවත්වන ලද තොරතුරු තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව හා පුහුණුලාභීන් සංඛ්‍යාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.

| වර්ෂය | පාඨමාලා සංඛ්‍යාව* | සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව* |
|---|---|---|
| 2013 | 05 | 93 |
| 2014 | 02 | 58 |
| 2015 | 01 | 28 |
| 2016 | 01 | 26 |
| 2017 | 01 | 13 |
| **මුළු සංඛ්‍යාව** | **10** | **218** |

#### 2.2.3.3. සමුපකාරික නොවන වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා

පාසැල් අධ්‍යාපනය අවසන් කර ව්‍යාපාරික ක්ෂේත්‍රයට අවතීර්ණවීමේ අපේක්ෂාවෙන් උසස් අධ්‍යාපනය යොමුවන තරුණ පරම්රාව වෙනුවෙන් සැලසුම් කරන ලද ව්‍යාපාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව සය මාසික අර්ධ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවකි.

ශ්‍රී ලංකා ශිල්පීය ගණකාධිකරණ ආයතනයේ ව්‍යාපාර සංවර්ධ උපාධි පාඨමාලාව සඳහා ප්‍රවේශ පාඨමාලාවක් ලෙස ගිවිසුම් ගතව ඇති මෙම පාඨමාලාව 2017 වසරතුල හඳුන්වාදෙන ලද පාඨමාලාවකි. ආරම්භක කණ්ඩායම ශිෂ්‍ය ශිෂ්‍යාවන් 26 දෙනෙකුගෙන් සමන්විතව ඇත.

| පාඨමාලාවේ නම | ආරම්භක දිනය | අවසන් කළ/අවසන් කිරීමට නියමිත දිනය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ව්‍යාපාර සංවර්ධන ඩිප්ලෝමා | 2017.03 | 2018.03 | 26 |

### 2.2.4. සහතික පත්‍ර පාඨමාලා

වාර්ෂික පුහුණු මාරගෝපදේශය තුල ඇතුලත් හා ඉන් බැහැරව අදාල කාලසීමාවතුලදී හඳුනාගනු ලබන සහතික පත්‍ර පාඨමාලා සැලසුම්කර පැවත්වීමට ආයතනය කටයුතු කරනු ලබන අතර 2017 වසර තුලදී පහත ක්ෂේත්‍රගත පාඨමාලාවන් පවත්වා ඇත

- සමුපකාරික වෘත්තීමය සහතිකපත්‍ර පාඨමාලා
- තොරතුරු තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලා
- භාෂා සහතිකපත්‍ර පාඨමාලා

#### 2.2.4.1. සමුපකාරික වෘත්තීමය සහතික පත්‍ර පාඨමාලා

සමුපකාර ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සෘජුව ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා ලියාපදිංචිවීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොමැති වෘත්තිකයන් සඳහා මෙම පාඨමාලාවන් සැලසුම් කෙරේ. එමෙන්ම විවිධ සමුපකාරික ආයතන වෙතින් ඉදිරිපත් කෙරෙන කාලීන අවශ්‍යතාවන් අනුව ද සහතිකපත්‍ර පාඨමාලා සංවර්ධනය කිරීම කරනු ලබයි.

සමාලෝචිත 2017 වසරතුල පැවැත්වූ පාඨමාලාවන්ගේ විස්තර දැක්වේ.

| පාඨමාලාවේ නම | ආරම්භක දිනය | අවසන්කළ/අවසන් කිරීමට නියමිත දිනය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| සමුපකාර කළමනාකරණ හා සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 2017.06.02 | 2017.12.30 | 34 |

#### 2.2.4.2. තොරතුරු තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලා

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය අවසන්කර උසස් පෙළ ප්‍රවේශය අපේක්ෂාවෙන් සිටින පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා මූලික තොරතුරු තාක්ෂණික දැනුම අපේක්ෂා කරනු ලබන වැඩිහිටි කාණ්ඩය ඉලක්ක ගත කර ඇති NVQ Level- 03 සහතික පත්‍රපාඨමාලාව හා වයස අවුරුදු 05 සිට ඉහළට දරුවන් වෙනුවෙන් සැලසුම්කර ඇති ඉ-කිඩ්ස් පාඨමාලාවන් මේ අතරින් ප්‍රමුඛ වේ.

| | පාඨමාලාවේ නම | සහභාගීත්වය |
|---|---|---|
| 1. | Certificate in Computer Application Assistant (NVQ Level 03) | 11 |
| 2. | E- kids Computer Learning - (PL & IL) | 10 |
| 3. | E- kids Computer Learning –IV | 12 |
| 4. | Computer Learning O/L ICT | 19 |
| 5. | Computer hardware Engineering | 07 |
| 6. | Web Base Trainnig Programme | 07 |
| | **එකතුව** | **66** |

2017 වර්ෂය තුළ දී පරිගණක සහතිකපත්‍ර පාඨමාලා 06 ක් ආරම්භ කර පුහුණුලාභීන් 66 දෙනෙකු ද වෙනුවෙන් සාර්ථකව පුහුණුව අවසන් කර ඇති අතර 2013-2017 කාලය තුල තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලා ප්‍රගතිය පහත පරිදිය.

| වර්ෂය | පාඨමාලා සංඛ්‍යාව* | සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව* |
|---|---|---|
| 2013 | 06 | 96 |
| 2014 | 6 | 106 |
| 2015 | 5 | 107 |
| 2016 | 6 | 136 |
| 2017 | 06 | 66 |
| **මුළු සංඛ්‍යාව** | **29** | **511** |

#### 2.2.5. භාෂා සහතිකපත්‍ර පාඨමාලා

විවිධ රැකියා නියුක්තිකයන් පාසැල් හැරගිය තරුණ තරුණියන් හා උක්ත භාෂාවන් වැඩි දියුණු කර ගැනීමේ අරමුණෙන් පසු වන්නන් සඳහා සැලසුම්කල ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලා දෙකක් 2017 වසරේ දී පවත්වා ඇත. ඒ සඳහා සිසුන් 24 දෙනෙකු සහභාගී වී ඇත.

| පාඨමාලාවේ නම | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|
| 1. ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාව - 01 | 11 |
| 2. ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාව - 02 | 13 |
| **එකතුව** | **24** |

#### 2.2.6. විෂයානුබද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන්

වාර්ෂිකව මෙම ආයතනය විසින් සමුපකාර ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සමුපකාර සමිති නායකයින්, සේවකයින් හා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවලට අනුයුක්ත නිලධාරීන් මෙන්ම රාජ්‍ය අංශයේ සේවකයින් ඉලක්ක කරගෙන ඉලක්කගත ක්ෂේත්‍රයන්ට අදාලව කෙටිකාලීන කළමනාකරණ හා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ.

මෙම වැඩසටහන් පූර්වයෙන් හඳුනාගත් ක්ෂේත්‍රයන් වෙනුවෙන් මෙන්ම අදාල අධ්‍යයන වර්ෂය තුලදී ඒ ඒ ආයතන විසින් ඉල්ලුම් කරන ක්ෂේත්‍රයන් වෙනුවෙන් ද පාඨමාලා සැලැසුම් කෙරේ.

### 2.2.7. පුහුණු මාර්ගෝපදේශය අනුව පැවැත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන්

පුහුණු මාර්ගෝපදේශයට ඇතුලත්කල කෙටිකාළීණ පාඨමාලා 21 ක් මෙම වර්ෂයතුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද අතර එමගින් පුහුණුලාභීන් 630 දෙනෙකු සඳහා පුහුණුව ලබාදීමට අපේක්ෂා කරන ලද ද වසර අවසාන වනවිට පුහුණු පාඨමාලා 19 ක් පවත්වා පුහුණු ලාභීන් 547 දෙනෙකු පුහුණු කරවා ඇත.

| | පාඨමාලාවේ නම | අපේක්ෂිත පුහුණු ලාභීන් ගණන | තත්‍ය සහභාගීත්වය |
|---|---|---|---|
| 1. | කළමනාකරණ විගණන හා පුහුණු වැඩසටහන | 30 | 25 |
| 2. | ලේකම් පරිචය පිළිබඳ පුහුණු වැඩසටහන | 30 | 23 |
| 3. | අලෙවිකරණය හා පාරිභෝගික සත්කාර පිළිබඳ වැඩසටහන 1 | 30 | 39 |
| 4. | ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණන පුහුණුව | 30 | 49 |
| 5. | අලෙවිකරණය හා පාරිභෝගික සත්කාර පිළිබඳ වැඩසටහන 2 | 30 | 33 |
| 6. | අධ්‍යක්ෂ මණ්ඩල පුහුණු වැඩසටහන | 30 | 28 |
| 7. | F 28 වාර්තා සමාලෝචන වැඩසටහන | 30 | 32 |
| 8. | විනය ක්‍රියාවලිය පිළිබඳ වැඩසටහන | 30 | 23 |
| 9. | විගණන ප්‍රමිත භාවිතය පිළිබඳ වැඩසටහන | 30 | 30 |
| 10. | තීරකකරණ කුසලතා සංවර්ධන වැඩසටහන | 30 | 27 |
| 11. | ග්‍රාමීය බැංකු නියාමන පුහුණු වැඩසටහන | 30 | 33 |
| 12. | සමුපකාර සමිති විධායක නිළධාරි පුහුණුව (නෛතික විධිවිධාන දැනුවත් කිරීම ) | 30 | 36 |
| 13. | සමුපකාර සමිති ඇවරකරණය පිළිබඳ පුහුණුව | 30 | 27 |
| 14. | කාර්යාල කළමනාකරණය සඳහා නව තාක්‍ෂණය හඳුන්වාදීම | 30 | 28 |
| 15. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන | 30 | 25 |
| 16. | Workshop on computer skills for prof (Advanced Excel ) | 30 | 22 |
| 17. | Workshop on computer skills for prof ( Hardware ) | 30 | 21 |
| 18. | Workshop on computer skills for prof ( Hardware ) | 30 | 21 |
| 19. | ණය කළමනාකරණය පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව | 30 | 25 |
| | | **570** | **547** |

### 2.2.8. පුහුණු මාර්ගෝපදේශයෙන් බැහැරව පැවැත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන්

2017 වර්ෂයේ දී සැලසුම්ගත කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීම අපේක්ෂිත ඉලක්කය වූ වැඩසටහන් 21 න් වැඩසටහන් 02 ක් පැවැත්විය නොහැකි වුවද, වාර්ෂික පුහුණු මාර්ගෝපදේශයට ඇතුලත් නොවූ වැඩසටහන් 04 ක් සැලසුම්කර පවත්වන ලද අතර එමගින් පුහුණුලාභීන් 169 දෙදෙනෙකු වෙත පුහුණුව ලබා දී ඇත.

| | පාඨමාලාව නම | පැවැත් වූ දින | පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|
| 1. | ගොවි සංවිධාන විගණනය සඳහා නිළධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන -01 | 2017.4.28-05.02 | 40 |
| 2. | සි/ස අහුගොඩ සණස සමිති අධ්‍යක්ෂ මණ්ඩල පුහුණුව | 2017.05.12-13 | 39 |
| 3. | ගොවි සංවිධාන විගණනය සඳහා නිළධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන -02 | 2017.06.15-19 | 45 |
| 4. | ගොවි සංවිධාන විගණනය සඳහා නිළධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන -03 | 2017.07.08-12 | 45 |
| | **එකතුව** | | **169** |

සමස්ථයක් වශයෙන් 2017 වර්ෂය තුල කෙටිකාලීන පුහුණු වැඩසටහන් 23 ක් පවත්වා පුහුණුලාභීන් 716 දෙනෙකු වෙනුවෙන් පුහුණුව ලබා දී ඇත.

2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුලදී මෙම ආයතනය මඟින් පවත්වන ලද විෂයානුබද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් සඳහා පුහුණුලාභීන් සංඛ්‍යාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ

| වර්ෂය | විස්තරය | |
|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වූ මුළු සංඛ්‍යාව |
| 2013 | 41 | 1,324 |
| 2014 | 51 | 1,879 |
| 2015 | 19 | 666 |
| 2016 | 22 | 711 |
| 2017 | 23 | 716 |
| **එකතුව** | **156** | **5,296** |

### 2.2.9. මහජන බැංකු ආධාර යටතේ පවත්වන ලද පාඨමාලා

සමුපකාර ව්‍යාපාරයේ අභිවෘද්ධිය ඉලක්කකර සමුපකාර ක්ෂේත්‍රයේ පුහුණු ආයතන වෙනුවෙන් වාර්ෂිකව වෙන්කරනු ලබන මූල්‍ය ප්‍රතිපාදන ඔස්සේ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය වෙත ලද ප්‍රතිපාදන මගින් සමුපකාර සමිති කාර්ය මණ්ඩල කලමනාකරණ කාර්යාභිවර්ධනය ඉලක්කකර ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් 04ක් පවත්වා පුහුණුලාභීන් 237 ක් සඳහා පුහුණුව ලබාදී ඇත.

මහජන බැංකු ආධාර යටතේ 2016 වසරේදී 237 වෙනුවෙන් පුහුණුව ලබා ද ඇති අතර 2017 වසරේ දී ද 230 දෙනෙකු වෙත දැනුම ලබාදී ඇත.

ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල විස්තර පහත පරිදි වේ.

| | පැවැත් වූ දිනය/දිනයන් | පුහුණු වැඩසටහනේ නම | පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|
| 01 | 2017.05.16-17 | විකුණුම් කාර්ය මණ්ඩල කාර්යභිවර්ධන පුහුණු වැඩසටහන 1 | 37 |
| 02 | 2017.05.18-19 | විකුණුම් කාර්ය මණ්ඩල කාර්යභිවර්ධන පුහුණු වැඩසටහන 2 | 24 |
| 03 | 2017.05.30-31 | විකුණුම් කාර්ය මණ්ඩල කාර්යභිවර්ධන පුහුණු වැඩසටහන 3 | 43 |
| 04 | 2017.11.13 | මධ්‍යම පළාත් සණස සමිතිවල කාරක සභිකයේ කාර්යභිවර්ධන පුහුණු වැඩසටහන 1 | 126 |
| | 2017.11.14 | මධ්‍යම පළාත් සණස සමිතිවල කාරක සභිකයේ කාර්යභිවර්ධන පුහුණු වැඩසටහන 2 | |
| | 2017.11.15 | මධ්‍යම පළාත් සණස සමිතිවල කාරක සභිකයේ කාර්යභිවර්ධන පුහුණු වැඩසටහන 3 | |
| | **එකතුව** | | 230 |

### 2.2.10. අන්තර් ජාතික පුහුණු වැඩසටහන්

ආයතනික පනතේ 4(ඒ) උප වගන්තිය ප්‍රකාරව ආයතනික කර්තව්‍යයට සමාන කර්තව්‍යය ඉටුකරන ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පිහිටි සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම අවශ්‍ය වේ. ජාත්‍යන්තර වශයෙන් සමුපකාර සංවිධාන හා සම්බන්ධතා පැවැත්වීම තුලින් ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරය වෙත හා මෙම ආයතනයේ ඉදිරි ප්‍රගමනය උදෙසා ඉතා වැදගත් කාර්යයකි.

ආයතනය අන්තර් ජාතික සමුපකාර සන්ධානයේ (International Cooperative Alliance) හා ඉන්දියාවේ පූනේ නුවර පිහිටි වෛකුන්ත්මේතා ජාතික සමුපකාර කළමනාකරණ ආයතනයේ, අන්තර්ජාතික සමුපකාරය හා කෘෂිකාර්මික බැංකුකරණ මධ්‍යස්ථානය (Center for International Co-operation and Training in Agricultural Banking) (CICTAB) යන ආයතනයන් හි සාමාජිකත්වය ලබා ඇත.

වෛකුන්ත්මේතා ජාතික සමුපකාර කළමනාකරණ ආයතනය සමඟ ඇතිකරගෙන ඇති අවබෝධතා ගිවිසුම ඔස්සේ සමුපකාරික වෘත්තිකයන් හුවමාරු කරගැනීම හා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් පවත්වනු ලබන අතර
2017 වසරේ දී වැඩසටහන් 03ක් පවත්වා ඉන්දිය හා දකුණු ආසියානු සමුපකාර වෘතිකයින් 76 කු සඳහා දේශීය සමුපකාරික අත්දැකීම් හා දැනුම ලබාදෙන ලද අතර 2016 වසරතුල එම සංඛ්‍යාව 60 දෙනෙකු විය.
පසුගිය වසර 03 ක කාලය තුල මෙම වැඩසටයනේ ප්‍රගතිය පහත සාරාංශය මගින් දැක්වේ.

| වර්ෂය | විස්තරය | |
|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වූ මුළු සංඛ්‍යාව |
| 2015 | 05 | 109 |
| 2016 | 03 | 60 |
| 2017 | 03 | 76 |
| **එකතුව** | **11** | **245** |

### 2.2.11. වෘත්තීය පාඨමාලා සඳහා සිසුන් සූදානම් කිරීම

රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් හා රජයේ සේවකයන් සඳහා පරිගණක දැනුම, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි දැනුම හා ගණකාධිකරණ හා කළමනාකරණ දැනුම ලබාදීම අරමුණු කරගෙන මෙම ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා මෙන්ම වෘත්තීය විභාග සඳහා සිසුන් පුහුණුකිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (Sri Lanka Institute of Charterd Accountancy), ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CMA) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනය (AAT), මගින් පවත්වනු ලබන විභාග සඳහා ගුණාත්මක දැනුමක් සහිත සිසුන් සූදානම් කිරීමේ අරමුණු සහ ආයතනික සමාජ මෙහෙවර පෙරදැරිව වෘත්තීය පාඨමාලා ආරම්භ කරන ලදී.

| පාඨමාලාවේ නම | කාලසීමාව | පුහුණුලාභීන් සංඛ්‍යාව* |
|---|---|---|
| I. AAT Foundation (AA1) සිංහල මාධ්‍යය | 2017 ජූනි | 32 |
| II. AAT 3 (AA3) සිංහල මාධ්‍යය | 2017 ජූලි | 05 |
| III. CA Executive Level- English Medium | 2017 සැප්තැම්බර් | 35 |
| IV. CA English Course (commiuniction & people Skills) | 2017 ජූලි | 24 |
| V. CA Business Level | 2017 දෙසැම්බර් | 16 |
| VI. AAT 2 (AA2) සිංහල මාධ්‍යය | 2018 ජනවාරි | 20 |
| VII. CA Executive Level- English Medium | 2018 මාර්තු | 30 |
| **එකතුව** | | **162** |

***2017 වසරේ නව ලියාපදිංචි කිරීම් පමණි**

2016 වර්ෂයේ දී පාඨමාලා 10 ක අධ්‍යයන කටයුතු ආරම්භ කර එමගින් සිසුන් 157 දෙනෙක් එම ආයතනවල විභාග සඳහා සූදානම් කරන ලද අතර 2017 වර්ෂයේ දී පාඨමාලා 07ක අධ්‍යයන කටයුතු ආරම්භ කර එමගින් සිසුන් 162 දෙනෙක් එම ආයතනවල විභාග සඳහා සූදානම් කරඇත.

### 2.2.12. 2017 වසරතුල ආයතනික සම්පත් උපයෝගී කරගෙන බාහිර ආයතන පැවැත්වූ පුහුණු වැඩසටහන්

ආයතනික කාර්යභාරය විවිධාංගීකරණය කිරීම හා දේපල පූර්ණ ධාරිතාවයෙන් සේවානියුක්ත කොට ආදායම් උත්පාදනය කිරීමේ අරමුණින් රාජ්‍ය,අර්ධ රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ හා රාජ්‍ය නොවන සංවිධාන සඳහා ද ආයතනික පහසුකම් උපයෝගිකර අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීමට අවස්ථාව සලසා ඇත.

ඒ අනුව 2017 වසරේදී ආයතනය විසින් එවැනි වැඩසටහන් 979 ක් පවත්වා පුහුණුලාභීන් 22,379 දෙනෙකු සඳහා දැනුම ලබාදීමට පහසුකම් සලසා ඇත. එය 2016 වර්ෂයට සාපේක්ෂව වැඩසටහන් සංඛ්‍යාවේ 204% හා පුහුණු ලාභීන් සංඛ්‍යාවේ 32% ඉහළ යාමකි.

| වර්ෂය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| **පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව** | 421 | 380 | 712 | 321 | 979 |
| **සහභාගි වූ මුළු සංඛ්‍යාව** | **24,014** | **23,475** | **36,965** | **16,955** | **22,376** |

සමාලෝචිත 2017 වසරතුල සමස්ථයක් වශයෙන් ආයතනය විසින් සැලසුම්කර සංවිධානය කරන ලද දෙස් විදෙස් පාඨමාලා හා වැඩසටහන් 59 මගින් විද්‍යාර්ථීන් 1579 ක් වෙනුවෙන් දැනුම හා පුහුණුව ලබා දී ඇති අතර බාහිර ආයතන වෙතින් සංවිධානය කරන ලද වැඩසටහන් 979 මගින් පුහුණු ලාභීන් 22,376 ක් ද වශයෙන් වැඩසටහන් 1,038 මගින් පුහුණුලාභීන් 23,955 වෙනුවෙන් අධ්‍යයන හා පුහුණු පහසුකම් සැලසීමට ආයතනය සමත්ව ඇත.

## 2.3. ආයතනයේ අධ්‍යයන පහසුකාරක සේවා ප්‍රගතිය

ආයතනයේ අධ්‍යයන කටයුතු සාර්ථක කරගැනීම වෙනුවෙන් සැකසුනු සහය සේවා රැසකින් මෙම ආයතනය පොහොසත්ය.

### 2.3.1.නේවාසික අංශය

ආයතනයේ පුහුණුව සඳහා පැමිණෙන පුහුණුවන්නන්ගේ නවාතැන් අවශ්‍යතා අනුව සියලු නේවාසිකයින් සඳහා ඉගෙන ගැනීමට සුදුසු පරිසරයක් හා ආරක්ෂා සහිතව නැවතීමේ පහසුකම් සැපයීම නේවාසික අංශයේ ප්‍රධාන කාර්ය වේ. ආයතනික නේවාසික අංශයේ නේවාසිකාගාර පිළිබඳ සවිස්තර වාර්තාවක් 2.iv යටතේ දක්වා ඇත.

නේවාසික අංශය මගින් පාලනය වන භෝජනාගාරය මඟින් නේවාසිකයින්ට , බාහිර හා අභ්‍යන්තර පුහුණුලාභීන්ගේ ඉල්ලීම් අනුව අවශ්‍ය වන ආකාරයට ආහාර පාන සැපයීම සිදු කරනු ලබන අතර දිනකට ආයතනයේ පුහුණුවීම් කටයුතුවල නියැලෙන 100 ත් 300 ත් අතර පුහුණුලාභීන් ප්‍රමාණයකට ආහාර සැපයීමට පහසුකම් සහිත භෝජනාගාරයක් ද මීට අයත්ය.

### 2.3.2.පුස්තකාල අංශය

ආයතනයේ අධ්‍යයන අංශය යටතේ ස්ථාපිත කර ඇති පුස්තකාලය විශේෂ පුස්තකාල යටතේ වර්ග කර ඇත. ආයතනයේ පාඨමාලා හදාරන පුහුණුලාභීන් හා ආයතනයේ කාර්ය මණ්ඩලය මෙහි නිත්‍ය පාඨකයින් වන්නේය.

වාර්ෂිකව ආයතනික අධ්‍යයන අවශ්‍යතා අනුව පුස්තකාලය සඳහා නව ප්‍රකාශන එකතු කිරීම සිදුකෙරේ. ඒ යටතේ 2017 වසර ඇතුලත පුස්තකාලයට නව ග්‍රන්ථ 100 ක් මිලදී ගෙන ඇති අතර පරිත්‍යාග වශයෙන් පොත් 10 විශ්‍රාමලත් කථිකාචාර්ය වරුන් දෙදෙනෙකු වෙතින් ලැබී ඇත. පොත් මිලදී ගැනීමේදී ප්‍රධාන විෂය ධාරාව වන සමුපකාර විෂය මෙන්ම සෙසු පාඨමාලා සඳහා අවශ්‍ය අනෙකුත් අනු විෂයන් වන කළමනාකරණය,ගණකාධිකරණය, විගණනය, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, බැංකු ආදී වශයෙන් විෂයන් ගණනාවක් කෙරෙහිද අවධානය යොමු කෙරේ. මේ වන විට පුස්තකාලය සතු මුළු පොත් සංඛ්‍යාව 22,053කි.

පුස්තකාලය සතුව සමුපකාර ක්ෂේත්‍රයට අදාල දුර්ලභ ගණයේ පොත් පත් රාශියක් හා 1911 සිට සමුපකාර ව්‍යාපාරය සඳහා නිකුත් කළ පනත් හා වාර්තාවල එකතුවක්ද ඇත.

දිනපතා හා සතිපතා පුවත්පත්වල පලවන සමුපකාර ක්ෂේත්‍රයට මෙන්ම පුහුණුලාභීන්ට වැදගත් වන තෝරාගත් ලිපි එක්රැස් කර විවිධ විෂයන් සඳහා වෙන් වෙන්ව පුවත්පත් අනුක්‍රමණිකා සාදා ඇත. එසේම 2009 වසරේ සිට සමුපදීපණී අතිරේක සියල්ලම පුස්තකාලය සතුව ඇත. පොත්පත්වලට අමතරව වාර සඟරා එකතුවක් මෙන්ම අමතර තොරතුරු ගවේෂණය සඳහා අන්තර්ජාල පහසුකම් ද ඇත.

### 2.3.3. විභාග අංශය

ලේඛකාධිකාරීගේ පූර්ණ අධීක්ෂණයට යටත් විභාග අංශය ආයතනය මඟින් පවත්වනු ලබන නිත්‍ය පුහුණු පාඨමාලා, වෘත්තිමය ඩිප්ලෝමා පාඨමාලා සහ සහතික පත්‍ර පාඨමාලා ඇතුලත් සෑම පාඨමාලාවක් සඳහාම විධිමත් විභාග පටිපාටියක් යටතේ සියලු විභාග පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීම කරනු ලබන්නේ විභාග අංශය මඟිනි.

ආයතනික පාඨමාලා ස්වරූපය අනුව සෑම මසකදීම වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා වෙනුවෙන් ද, නිත්‍ය පුහුණු පාඨමාලාවන් වෙනුවෙන් සෑම වාරයක්/ පාඨමාලාව අවසානයේ දී විභාග පැවැත්වීම කෙරේ.

මෙම නිත්‍ය කාර්යයට අමතරව ආයතනය වෙත කෙරෙන බාහිර ඉල්ලීම් අනුව සමුපකාර සමිති වෙනුවෙන් විවිධ කරුණු සඳහා ආයතනික අධ්‍යයන හා සංවර්ධන අංශය සමඟ එක්ව විභාග සංවිධානය කර පැවැත්වීම ද සිදුකෙරේ.

විභාග අංශය විසින් සමාලෝචිත වසරතුල දී අධ්‍යයන මණ්ඩල රැස්වීම් 01 ක් පවත්වා ඇත.

| දිනය | පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | පෙනීසිටි | සමත් | ඌන සමත් | අසමත් |
| 2017.03.30 | සමුපකාර සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව2016/2015 – (ඌව පළාත) | 34 | 31 | 01 | - |
| | සමුපකාර සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව 2014/15 (පුනර් පරීක්ෂණ) | 01 | 01 | - | - |
| | සමුපකාර සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව 2013/14 (පුනර් පරීක්ෂණ) | 08 | 08 | - | - |
| | සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව 2011/12 (පුනර් පරීක්ෂණ) | 01 | 01 | - | - |
| | සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව 2014/2015 (පුනර් පරීක්ෂණ) | 02 | 02 | - | - |
| | බැංකු කළමනාකරන ඩිප්ලෝමා පාඨමාලාව 2012/13 (පුනර් පරීක්ෂණ) | 01 | 01 | - | - |
| | බැංකු කළමනාකරන ඩිප්ලෝමා පාඨමාලාව 2013/14 (පුනර් පරීක්ෂණ) | 01 | 01 | - | - |
| | ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2015/16 | 04 | 04 | - | - |
| | මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2015/16 (පුනර් පරීක්ෂණ) | 03 | 03 | - | - |
| | බැංකු කළමනාකරන ඩිප්ලෝමා පාඨමාලාව 2015/16 (පුනර් පරීක්ෂණ) | 02 | 02 | - | - |
| | විගණන ඩිප්ලෝමා පාඨමාලාව 2015/16 (පුනර් පරීක්ෂණ) | 03 | 03 | - | - |
| | ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව- 2013/14 (පුනර් පරීක්ෂණ) | 01 | 01 | - | - |
| | ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව – 2015(පුනර් පරීක්ෂණ) | 01 | 01 | - | - |
| | ව්‍යවසායකත්ව සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව 2015/2014 -(පුනර් පරීක්ෂණ) | 02 | 02 | - | - |

### 2.3.4. මුද්‍රණාල අංශය

ආයතනයේ සියලුම පාඨමාලා සඳහා අවශ්‍ය කරන නිබන්ධන හා දේශන සටහන් මුද්‍රණය කිරීම හා පොත් සඟරා මෙන්ම බාහිර ආයතන මඟින් කෙරෙන ඉල්ලීම මත මුද්‍රණ කටයුතු කිරීම මුද්‍රණාල අංශය මඟින් කෙරෙන අතර මධ්‍යම මට්ටමේ මුද්‍රණාලයකට අවශ්‍ය කෙරෙන මුද්‍රණාල උපකරණවලින් සමන්විත අංග සම්පූර්ණ මුද්‍රණාලයක් ආයතනය සතුව පවතී.

2017 වර්ෂයේ දී මුද්‍රණ කාර්යයන් මගින් **රු.102,234.00** මුදලක් උපයා ඇත.

### 2.3.5. ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය

පුහුණු වැඩසටහන් වලදී අවශ්‍ය වන ශ්‍රව්‍ය දෘෂ්‍ය සහය සේවාව සැපයීම ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය මඟින් සිදු කරනු ලබයි. වීඩියෝ චිත්‍රපට ප්‍රදර්ශන යන්ත්‍ර, ශීර්ෂ ප්‍රක්ෂේපන යන්ත්‍ර, ශබ්දවාහිනී යන්ත්‍ර පුහුණු වැඩසටහන් සඳහා ලබාදීම මෙන්ම ආයතනය විසින් සිදු කරනු ලබන විවිධ වැඩසටහන් ඡායාරූප ගත කිරීම හා වීඩියෝ ගත කිරීමත් මෙම අංශයෙන් සිදු කරනු ලබන තවත් සේවාවකි.

### 2.3.6. ශ්‍රවනාගාරය

ආයතනික කාර්යභාරය විවිධාංගීකරණය යටතේ ජාතික හා ජාත්‍යයන්තර මට්ටමේ ශ්‍රවනාගාර අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ හා සමුපකාර ක්ෂේත්‍රයේ එකම ජාතික පුහුණු ආයතනය වශයෙන් ක්ෂේත්‍රයට දායාද කරනලද ආයතනික ශ්‍රවනාගාරය 2014.11.13 දින විවෘත කිරීමෙන් පසු 2015 වසරේ සිට ක්‍රියාත්මක තත්වයට පත්කිරීමට හැකියාව ලැබින.

සමාලෝචිත 2016 වසරතුල වැඩසටහන් 10 ක් පවත්වා රු.3,532,500.00 මුදලක් උපයන ලද අතර 2017 වසරේ දී වැඩසටහන් සංඛ්‍යාව 18 දක්වා ඉහළ ගිය අතර සමස්ථ ආදායම රුපියල් 4,680,009 ක් දක්වා වැඩි වී ඇත. අදායමේ මෙම වැඩිවීම 32% ක ඉහළ යාමකි.





## 2.4. භෞතික සම්පත් සංවර්ධනය

භෞතික සම්පත් සංවර්ධන කටයුතු සම්බන්ධව 2017 විශේෂ කටයුතු රැසක් ඉටුකරන ලද වසරකි. 2016 වසරේ දී නවීකරණය කරගැනීමට නොහැකි වූ අත්‍යාවශ්‍ය ගොඩනැගිලි සඳහා මෙම වසර තුළ ප්‍රමුඛතාවය ලබාදෙන ලදී.

2017 වසර වෙනුවෙන් භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන මිලියන 20 ක මුදලක් වෙන්වූ අතර එම මුදල ඉලක්ක කරගෙන අදාල ගොඩනැගිලි මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික උපදේශනය ලබාගනිමින් නවීකරණය කර සේවා ලාභීන් වෙනුවෙන් වඩාත් උසස් පහසුකම් සැපයීමට කටයුතු කරන ලදී.

මෙම නවීකරණ කටයුතුවල සාරාංශය පහත පරිදි වේ.

| **විස්තරය** | **ඇස්තමේන්තු මුදල (බදු රහිත)** | **කොන්ත්‍රාත් මුදල (බදු රහිත)** |
|---|---|---|
| නේවාසිකාගාර D, E හා , H ගොඩනැගිලි ,නව රොචිඩේල් දේශන ශාලාව සහ තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ල නවීකරණය කිරීම. | 16,215,406.40 | 15,785,412.00 |

# ආයතනික වර්තමාන අභියෝග

**3. ආයතිනක වර්තමාන අභියෝග**

ආයතනය මඟින් සමාලෝචිත 2017 වසරතුල සියළුම ආකාරයේ පුහුණු වැඩසටහන් 1038 මෙහෙයවා සෘජු සේවා ලාභීන් 23955 දෙනෙකු වෙනුවෙන් අධ්‍යයනමය සේවාවන් ද ශ්‍රවනාගාරය තුල වැඩසටහන් 18 ක් පවත්වා ආසන්න වශයෙන් 18000 ක් වූ කණ්ඩායමකට ද සේවා අවස්ථා ලබා දී ඇති අතර, මෙම කටයුතුවලදී රුපියල් මිලියන 36 ක් ඉක්මවූ අදායමක් උපයා ඇති අතර සමාලෝචිත වසර තුල රුපියල් මිලියන 15 ක ප්‍රාග්ධන වැයකිරීම් ද ඇතුලත්ව රුපියල් මිලියන 59ක් වූ වැය ශීර්ෂයකට අදාල කටයුතු ඉටුකර ඇත.

මෙම කාර්යයන් ඉටුකිරීමේ දී ආයතනය මුහුණ දෙනු ලැබූ අභියෝගයන් හා දුෂ්කරතාවයන් ද පවතී,

- සමස්ථ ක්‍රියාකාරීත්වය වෙනුවෙන් 2017 වසරතුල ආයතනික කාර්ය මණ්ඩලය 39 දෙනෙක් පමණක් සේවා නියුක්ත වූ අතර අනුමත කාර්ය මණ්ඩලය වූ 71 න් 32 දෙදෙනෙකුගේම පුරප්පාඩු පවතී. මෙය ආයතනික සංවර්ධනයට මහත් බාධාවකි.
- අනුමත අධ්‍යයන කථිකාචාර්ය මණ්ඩලය 12 දෙනෙකු වුව ද ඉන් 50% ක් 2017 වසරතුල පුරප්පාඩුව පැවතීම සමුපකාර ව්‍යාපාරය මගින් අපේක්ෂිත හා ආයතනය මඟින් සැලසුම් කරන ආකාරයෙන් අධ්‍යයන හා පුහුණු කටයුතු පවත්වාගෙන යාමට බාධාවකි.
- සමුපකාර විෂය පළාත් සභා විෂයයක් වීමත් ඒ හේතුවෙන් පළාත් මට්ටිමෙන් පුහුණු ආයතන ආරම්භ කිරීමට පියවර ගැනීම අධ්‍යයන කටයුතුවලදී දැඩි අභියෝගයකි.

මෙම අභියෝගයන් ජය ගැනීම 2018 වසර වඩාත් සාර්ථක වසරක් බවට පත් කරගැනීමට අත්‍යාවශ්‍ය සාධකයකි.

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිළධාරී.

# මූල්‍ය වාර්තා

## 4. මූල්‍ය වාර්තා

### 4.1. 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| | සටහන් | 2016.12.31 දිනට රු. | 2017.12.31 දිනට රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 2 | 602,506,781 | 609,832,158 |
| අනෙකුත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 3.1 | 1,713,749 | 1,944,305 |
| | | 604,220,530 | 611,776,463 |
| ට්‍රාන්ස්ෆෝමරය හා තිර රෙදි මත විලම්බිත අයභාර වියදම් | 3.2 | 3,572,310 | 3,468,415 |
| අඩුකලා : ආදායමට එරෙහිව විලම්හිත අයභාර වියදම් ලිහාහැරීම | | (103,895) | (103,895) |
| විලම්හිත අයභාර වියදම් ඉතිරි ශේෂය | | 3,468,415 | 3,364,520 |
| **ජංගම වත්කම්** | | | |
| ජංගම ආයෝජන | 4 | 7,981,267 | 8,895,031 |
| තැන්පතු සහ ණය ගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂය | 5 | 40,064,254 | 46,511,421 |
| තොග | 6 | 1,134,572 | 1,639,811 |
| බැංකුවේ ඇති මුදල් | 7 | 94,491,494 | 70,192,352 |
| | | **143,671,587** | **127,238,616** |
| **මුළු වත්කම්** | | **751,363,532** | **742,379,599** |
| **හිමිකම් සහ වගකීම්**<br>**ප්‍රග්ධනය හා සංචිත** | | | |
| ප්‍රග්ධනය | 8 | 233,254,215 | 233,254,215 |
| සමුච්චිත ලාභය/(අලාභය) | 9 | (86,059,588) | (83,550,308) |
| | | **147,194,627** | **149,703,907** |
| **සංචිත** | | | |
| භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | 10 | 445,505,844 | 427,629,994 |
| අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | 11 | 15,858,435 | 15,474,343 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 20,901,444 | 20,901,444 |
| ආයතනික අරමුදල | | 4,604,805 | 4,884,730 |
| ප්‍රකාශන අරමුදල | | 5,439,297 | 6,035,563 |
| | | **492,309,826** | **474,926,074** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| **පාරිතෝෂික සඳහා වෙන් කිරීම්** | | 4,954,096 | 6,554,435 |
| සමුපකාර අරමුදලින් ලද ණය | | 25,000,000 | 25,000,000 |
| | | **29,954,096** | **31,554,435** |
| **ජංගම වගකීම්** | | | |
| ණය හිමියන් සහ උපචිත වියදම් | 12 | 59,995,237 | 60,532,595 |
| රැඳවුම් මුදල් | | 21,909,747 | 25,662,588 |
| | | **81,904,983** | **86,195,183** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **751,363,532** | **742,379,599** |

ලලිත් ගගේවත්ත
සභාපති

එල්.ඒ සුජාතා විජේසිංහ අධ්‍යක්ෂ ජනරාල්

කේ.ඩී.අනිල් ජ්‍යෙෂ්ඨ කළමණාකරු- මූල්‍ය

## 4.2. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් වියදම් ප්‍රකාශය

| | සටහන් | සත්‍ය 2016 | සත්‍ය 2017 |
|---|---|---|---|
| ආදායම් | | රු. | රු. |
| පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 13 | 30,225,739 | 31,145,190 |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | | 26,166,575 | 26,260,692 |
| අනෙකුත් ආදායම් | 14 | 29,489,144 | 36,184,366 |
| | | 85,881,458 | 93,590,248 |
| අඩුකලා : වියදම් | | | |
| 01. වැටුප් හා වේතන | 15 | 32,875,799 | 32,912,050 |
| 02. ගමන් වියදම් | 16 | 499,670 | 347,155 |
| 03. සැපයුම් | 17 | 3,856,367 | 4,498,298 |
| 04. නඩත්තු වියදම් | 18 | 856,605 | 981,193 |
| 05. ගිවිසුම් ගත සේවා | 19 | 19,259,345 | 19,108,120 |
| 06. වෙනත් | 20 | 1,623,121 | 1,918,204 |
| 07. ක්ෂය කිරීම් | 21 | 30,478,198 | 31,212,052 |
| 08. විලම්භිත වියදම් ලියාහැරීම | | 103,895 | 103,895 |
| | | 89,553,000 | 91,080,968 |
| අසාමාන්‍ය අයිතම්වලට පෙර ආදායම ඉක්මවූ අතිරික්තය/(ඌනණය) | | (3,671,541) | 2,509,280 |
| අඩු කලා බදු සඳහා වෙන් කිරීම් | | - | |
| බද්දට පසු ආදායම ඉක්මවා ඇති අතිරික්තය හෝ ( ඌනණය) | | (3,671,541) | 2,509,280 |
| වෙනත් විස්තීර්ණ ආදායම් -දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය මත ලාභය | | - | - |
| ශුද්ධ අතිරික්තය/(ඌනණය) | | (3,671,541) | 2,509,280 |

## 4.3. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2016 රු. | | 2017 රු. | |
|---|---|---|---|---|
| **බදුවලට පෙර ආදායම් ඉක්මවූ වියදම්** | | **(3,671,541)** | | **2,509,280** |
| **ගැළපීම්** | | | | |
| ක්ෂවීම් | 30,478,198 | | 31,212,052 | |
| විලම්භිත වියදම් ක්‍රමක්ෂය | 103,895 | | 103,895 | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන | (26,166,532) | | (26,260,692) | |
| | - | | - | |
| ස්ථාවර වත්කම් විකුණුම් ලාභ | - | | - | |
| බොල් ණය වෙන් කිරීම | (61,188) | | 182,373 | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | 1,229,551 | | 1,600,339 | |
| අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන | (341,413) | | - | |
| අයභාර වියදම් සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන | - | | (23,250) | |
| ප්‍රත්‍යාගණන ලාභ | - | | (210,875) | |
| පෙර වර්ෂ ගැලපුම් | - | | | |
| පොළී ආදයම | (358,434) | | (504,360) | |
| රැඳවුම් මුදල් | (27,623) | | - | |
| ටෙන්ඩර් තැන්පතු | - | | - | |
| ලැබී ඇති අත්තිකාරම් | | | | |
| | (966,007) | | - | |
| ආයතනික අරමුදලට මාරු කිරීම් | 305,895 | 4,196,341 | | 6,099,482 |
| **කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් ලාභය/පාඩුව** | | **524,799** | | **8,608,762** |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම** | | | | |
| ණයගැති අඩුවීම් (වැඩිවීම්) | (990,684) | | (6,629,540) | |
| යෙදවුම් බදු වැඩිවීම් | - | | - | |
| උපචිත වියදම් සහ ණයහිමි වැඩිවීම් (අඩුවීම්) | 2,435,146 | | 537,358 | |
| තොග අඩුවීම් හා (වැඩිවීම්) | 231,671 | | (505,239) | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ මුදල් ගලායෑම්** | | **1,676,133** | | **(6,597,422)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ගලායෑම්** | | | | |
| රඳවාගත් මුදල් | 360,811 | | 32,778 | |
| දේපල, යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම් | | | | |
| - ඉඩම් සංවර්ධනය | - | | | |
| - ගොඩනැගිල් වැඩිදියුණුකිරීම | - | | (29,213,821) | |
| - යන්ත්‍ර පිරියත හා උපකරණ | (603,450) | | (2,464,990) | |
| - ලී බඩු සහ උපකරණ | (438,293) | | (2,921,120) | |
| - පුස්තකාල පොත් | (49,723) | | (112,657) | |
| - වෙනත් උපකරණ | (19,500) | | - | |
| කෙරීගෙන යන වැඩ ප්‍රාග්ධන ආයෝජන | (3,936,049) | | (77,779) | |
| විලම්භිත වියදම් ක්‍රමක්ෂය | | | | |
| කාර්ය මණ්ඩල ණය | (722,328) | | (1,144,319) | |
| දිගුකාලීන ආයෝජන | - | | - | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල | - | | 210,875 | |
| කඩා වැටුණු වහලයේ අයිතම විකිණීමෙන් ලද මුදල | - | | - | |
| පොළී ආදයම | 358,434 | | 504,360 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල් ගලායෑම්** | | **(5,050,098)** | | **(35,186,673)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ගලායෑම්** | | | | |
| භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන දීමනා | 13,000,000 | | 8,000,000 | |
| ආයතනික අරමුදල | - | | 279,925 | |
| ප්‍රකාශන අරමුදල | 441,730 | | 596,266 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල් ගලා යෑම | | **13,441,730** | | **8,876,191** |
| වර්ෂය තුළ ශුද්ධ මුදල් ගලායෑම් වැඩිවීම් | | **10,592,565** | | **(24,299,142)** |
| කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ | | **83,898,929** | | **94,491,494** |
| කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ | | **94,491,494** | | **70,192,352** |

## 4.4. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය

| | ප්‍රාග්ධනය | ලාභ/අලාභ | ප්‍රාග්ධන ලැබීම් (භාණ්ඩාගාර) | ප්‍රත්‍යාගණන අතිරික්ත | ප්‍රාග්ධන ලැබීම් (අමාත්‍යාංශ) | අරමුදල් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2016.01.01 දිනට ශේෂය** | **233,254,215** | **(83,517,778)** | **457,571,860** | **20,901,444** | **16,659,014** | **9,296,476** | **654,462,231** |
| අඩුකලා: රජයේ ප්‍රතිපාදන මත මිලදී ගත් ස්ථාවර වත්කම් මත ක්ෂය | - | - | (25,066,015) | - | (1,100,517) | | (26,166,532) |
| කාලපරිච්ඡේදයේ ලාභ/පාඩු | - | (3,671,541) | - | - | | 441,730 | (3,229,811) |
| පෙර වර්ෂයේ ගැලපීම් | | 1,129,730 | - | - | | - | 1,129,730 |
| කාල පරිච්ඡේදය තුළ ආයෝජන | | - | 13,000,000 | - | 2,938 | 305,895 | 13,308,833 |
| අඩුකලා : ක්ෂයවීම් | | | | | | | |
| **2016.12.31 දිනට ශේෂය** | **233,254,215** | **(86,059,589)** | **445,505,845** | **20,901,444** | **15,858,435** | **10,044,101** | **639,504,451** |
| **2017.01.01 දිනට ශේෂය** | **233,254,215** | **(86,059,589)** | **445,505,845** | **20,901,444** | **15,858,435** | **10,044,101** | **639,504,451** |
| අඩුකලා: රජයේ ප්‍රතිපාදන මත මිලදී ගත් ස්ථාවර වත්කම් මත ක්ෂය | - | - | (25,875,850) | - | (384,842) | - | (26,260,692) |
| කාලපරිච්ඡේදයේ ලාභ/පාඩු | - | 2,446,322 | - | - | - | 596,266 | 3,042,588 |
| පෙර වර්ෂයේ ගැලපීම් | - | - | - | - | - | - | - |
| කාල පරිච්ඡේදය තුළ ආයෝජන | - | - | 8,000,000 | - | - | - | - |
| **2017.12.31 දිනට ශේෂය** | **233,254,215** | **(83,613,267)** | **427,629,995** | **20,901,444** | **15,473,593** | **10,920,293** | **624,566,273** |

## 4.5. 2017.12.31 දිනට ගිණුම් සම්බන්ධ සටහන්

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

### පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### ගිණුම්කරණ සම්ප්‍රදායයන්

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්වලට සටහන් වලින් සමන්විත වේ. ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසිකව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කොට ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රමිතීන් ඒකීයව යොදවනු ලැබේ.

#### ගිණුම් ආකෘති

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ගිණුම් ආකෘතීන්ට අනුකූලව පිළියෙල කොට ඇත. වර්තමාන වර්ෂය සමඟ ඒකීය වන අයුරින් පෙර වර්ෂවල වාර්තා අගයන් සහ ප්‍රකාශනයන් යළි සකස් කොට ඇත.

#### ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට භාජනය කර ඇති අතර, අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කිරීම් සහ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

### වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

#### දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගත් පිරිවැය හෝ ඉදිකිරීමට වැය කරන ලද අගය සමඟ ඒවායේ පිරිවැය හා අදාල කරගත හැකි අනෙකුත් වියදම් සමඟ ඉදිරිපත් කොට ඇත. දේපල, පිරියත සහ උපකරණ ගිණුම්ගත කොට ඇත්තේ පිරිවැය හෝ ප්‍රති අගය කරන ලද වටිනාකමෙන්, පහත සඳහන් අනුපාතයන්ට අනුව කරන ලද සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසුවයි.

#### ක්ෂය කිරිම

වත්කම්වල පිරිවැය, ඒවායෙහි ඇස්තමේන්තු ගත ඵලදායී ජීවිත කාලය පුරා සමාන වාර්ෂික වාරික වලින් ලියා හැරීම පදනම් කොට ගෙන පහත සඳහන් පරිදි ක්ෂයවීම් සඳහා වෙන් කිරීම් ගණනය කොට ඇත.

| වත්කම | ඵලදායි ජීවිත කාලය |
|---|---|
| ගොඩනැගිලි | වර්ෂ 40 |
| මෝටර් රථ වාහන | වර්ෂ 04 |
| ලීබඩු සහ උපකරණ | වර්ෂ 10 |
| පොත් සහ සඟරා | වර්ෂ 04 |
| යන්ත්‍ර සූත්‍ර - විදුලි ජනක | වර්ෂ 20 |
| යන්ත්‍ර සූත්‍ර - ශ්‍රවනාගාර වායු සමන යන්ත්‍ර | වර්ෂ 10 |
| යන්ත්‍ර සූත්‍ර - ඉහත නොවන | වර්ෂ 05 |

ඉහුම් පිහුම් උපකරණ හා අනෙකුත් දෑ වර්ෂ 03

ස්ථාවර වත්කම් වෙනුවෙන් ක්ෂය කිරීම් කාළය පදනම්කර සිදුකෙරේ.
විදුලිය බල මණ්ඩලය වෙතින් සපයන ලද ට්‍රාන්ස්පෝමර් 02 ක් වෙනුවෙන් දරන ලද වියදම රු.4,155,818.00 කි.

## වගකීම් සහ වෙන් කිරීම්

### පාරිතෝෂික සඳහා වෙන් කිරීම්

ශේෂ පත්‍ර දිනයේ සිට වාර්ෂික සේවා කාලයක් ඉක්මවා ඇති සේවා දායකයින් සඳහා 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත අනුව විශ්‍රාම ගැන්වීමේ පාරිතෝෂික සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.
අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි වලට අනුකූලව සේවාදායකයින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට හිමිකම් කියනු ලබයි. ආයතනය විසින් පිළිවෙලින් 15% සහ 3% වශයෙන් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවාදායකයන්ගේ මූලික වැටුප හා ජීවන වියදම් දීමනාව මත දායක වනු ඇත.

### බොල් ණය සඳහා ප්‍රතිපාදන

5% බොල් ණය සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

### අනෙකුත් වගකීම්

නඩු මගට බැස ඇති සේවකයින් හා අනෙකුත් පාර්ශවයන් වෙනුවෙන් රුපියල් 217,200/= ක මුදලක් ප්‍රතිපාදන ලෙස වෙන් කිරීමත් මූල්‍ය ප්‍රකාශවල කර ඇත.

අනවසර පදිංචියකට අදාලව හිටපු සේවකයෙකු වෙතින් නිල නිවාස කුලිය හා දණ්ඩන කුලිය ද ඇතුලත්ව රු.645,122.00 මුදලක් අය කරගැනීමට නීතිමය පියවර ගෙන ඇතත්, අදාල විත්තිකරු 2015/10/10 දින අභාවප්‍රාප්තවීම හේතුවෙන් එම මුදල නැවත ආවරණය කරගැනීම පිළිබඳව අවිනිශ්චිතභාවයක් ඇත.

හිටපු සේවකයෙක් විසින් නඩු 02ක් ගොනුකර ඇත.

## ආදායම් හඳුනාගැනීම

- සපයන ලද සේවා සඳහා ගාස්තු උපචිත පදනම මත ගිණුම්ගත කරනු ලැබේ.
- ඩිප්ලෝමා පාඨමාලා ගාස්තු ,අනෙකුත් සහතික පත්‍ර පාඨමාලා ගාස්තු සහ ආයෝජන මත ඉපයූ පොළී ආදායම අදාල සේවාව සපයන ලද මත වාර්ෂික පදනමෙන් ගිණුම්ගත කර ඇත.

## වියදම්

රක්ෂණ වාරික හැර සෙසු සියළු වියදම් උපචිත සංකල්පයට අනුව ගිණුම්ගත කරනු ලැබේ.රක්ෂණ වාරික පමණක් වාර්ෂික පදනමෙන් ඇතුලත්ව ඇත.

## රජයේ ප්‍රතිපාදන

ප්‍රාග්ධන ස්වරූපයෙන් ලබන රජයේ ප්‍රතිපාදන වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ සංචිත ලෙස හඳුනා ගනු ලබයි.

**ප්‍රාග්ධන ප්‍රතිපාදන**

**පුනරාවර්තන ප්‍රතිපාදන**

ප්‍රතිපාදන ලැබූ වර්ෂයේ ආදායම් ලෙස ආදායම් සහ වියදම් ගිණුමේ ගිණුම්ගත කරනු ලැබේ.ප්‍රයෝජනයට නොගත් පුනරාවර්තන ප්‍රතිපාදන මූල්‍ය තත්ව ප්‍රකාශනය තුල වගකීමක් ලෙස පෙන්වා ඇත.

සමාලෝචිත වර්ෂයේදී පුහුණු වැඩසටහන් සඳහා මහජන බැංකුවේ සමුපකාර අරමුදලෙන් ප්‍රදාන ලැබී නැත.නමුත් 2016 වසරතුල ලද රු.975,000.00 මුදල 2017.01.01 වන විට ප්‍රයෝජනයට නොගත් ප්‍රදානයක් ලෙස හේෂව පැවති අතර එම මුදලින් රු.534,747.00 මුදලක් වැඩසටහන් 05 ක් වෙනුවෙන් 2017 වසර තුලදී වැය කරන ලද අතර එම වටිනාකම ආදායම් ප්‍රදානයක් ලෙෂ ආදායම් වියදම් ප්‍රකාශනයේ ඇතුලත් කර ඇත.

උපයෝජනය නොකළ කොටස ණයකරුවන් කොටසේ ඇතුලත් කර ඇත.

- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ආයතනයේ කළමනාකාරිත්වයේ වගකීමකි.
- ගබඩාවේ හා මුද්‍රණාලයේ 2017/12/31 දිනට පැවති තොග "සාමාන්‍යකරණ ක්‍රමය" මත ගණනය කර ඇති අතර, මුද්‍රිත ද්‍රව්‍යයන් ඒවායේ පිරිවැය මත වටිනාකම සකසා ඇත.
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට පිළියෙල කර ඇත.
- ස්ථිර සේවකයින් 35 ක් හා අනියම් සේවකයින් දෙදෙනෙක ද පුහුණු ලාභීන් 04 දෙනෙකුද 2017/12/31 දිනට සේවයේ නියුක්ත වූ අතර, ඊට අමතරව රේඛීය අමාත්‍යාංශය වෙතින් අනියුක්ත කළ සංවර්ධන නිළධාරීන් 05 දෙනෙකු සේවා නියුක්ත විය.
- සමුපකාර විෂයට අදාල ග්‍රන්ථ ප්‍රකාශයට පත්කිරීමේ අරමුණින් රේඛීය අමාත්‍යාංශයෙන් රු.මි.3.4ක් ලැබී ඇත.මෙම අරමුදලට අදාල ගණුදෙනු වෙනම පොත් කට්ටලයක පවත්වා ගෙන යායුතු බවට රේඛීය අමාත්‍යාංශය විසින් උපදෙස් දී ඇති උපදෙස් පරිදි අදාල පොත් කට්ලය පවත්වගෙන යනු ලබන අතර 2017 වර්ෂය සඳහා වූ ආදායම් වියදම් සහ මූල්‍ය තත්ව ප්‍රකාශය අමුණා ඇත.
- සමාලෝචිත 2017 වසරතුලදී ප්‍රකාශණ අරමුදල් හා ආයතනික අරමුදල ආයෝජනය තුලින් උපයන ලද පොළී ආදායම පිළිවෙලින් රු.572,262 ක් හා රු.279,138 කි. මෙම ආදායම් ආදල අරමුදල් වෙත ආදායම් වියදම් ගිණුම ඔස්සේ වෙන වෙනම බැරකර ඇත.
- වසර 2006-2015 කාල පරාසයට අදාලව ජීවන වියදම් දීමනාව ඇතුලත්ව සේවා නියුක්ති හා සේවක භාරකාර අරමුදල් ගෙවීමේ ක්‍රමය මත සේවා නියුක්තියන්ගේ භාර අරමුදල වෙත රු.4,181,639.79 මුදලක් හා සේවක භාරකාර අරමුදල වෙත රු.501,796.97 මුදලක් හිඟ මුදල් වශයෙන් ගෙවීමට ඇත.

සටහන : 02
දේපල, පිරියත හා උපකරණ

| පිරිවැය/ ප්‍රත්‍ය අගය | 2017.01.01 දිනට ශේෂය | පෙර වර්ෂයේ ගැලපීම් | | ගැලපීම්වලට පසු ශේෂය | වසර තුළ එකතු කිරීම් | ගැලපීම් (එකතු කිරීම්) | ගැලපීම් (අඩු කිරීම්) | 2017.12.31 දිනට සත්‍ය අගය රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | එකතු කිරීම් | අඩු කිරීම් | | | | | |
| ඉඩම් | 135,040,306.01 | - | - | 135,040,306.01 | - | - | - | 135,040,306.01 |
| ගොඩනැගිලි සහ ආකෘති | 452,742,785.69 | - | - | 452,742,785.69 | 36,410,053.00 | - | | 489,152,838,.34 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 100,089,731.49 | - | - | 100,089,731.49 | 2,570,840.00 | - | (386,885) | 102,273,686.65 |
| රථවාහන | 16,914,588.00 | - | - | 16,914,588.00 | - | - | - | 16,914,588.00 |
| ගෘහ භාණ්ඩ | 42,250,385.27 | - | - | 42,250,385.27 | 3,298,399.00 | - | (44,815) | 45,503,969.47 |
| පුස්තකාල පොත් | 2,383,982.35 | - | - | 2,383,982.35 | 113,407.00 | - | - | 2,497,389.35 |
| තිරරෙදි සහ වෙනත් | 1,879,572.25 | - | - | 1,879,572.25 | - | - | - | 1,879,572.25 |
| **එකතුව** | **751,301,351.06** | - | - | **751,301,351.06** | **42,392,699.00** | - | - | **793,262,350.07** |
| සමුච්චනය කළ ක්ෂවීම් | 2017.01.01 දිනට ශේෂය | පෙර වර්ෂයේ ගැලපීම් එකතු කිරීම් | අඩු කිරීම් | ගැලපීම්වලට පසු ශේෂය | වසර තුළ එකතු කිරීම් | ගැලපීම් (එකතු කිරීම්) | ගැලපීම් (අඩු කිරීම්) | 2016.12.31 දිනට සත්‍ය අගය රු. |
| ගොඩනැගිලි සහ ආකෘති | 73,999,934.09 | - | - | 73,999,934.09 | 11,959,409.00 | - | - | 85,959,343.09 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 45,810,051.56 | - | - | 45,810,051.56 | 13,915,416.00 | - | (386,885) | 59,338,582.56 |
| රථවාහන | 12,214,587.00 | - | - | 12,214,587.00 | 1,487,500.00 | - | - | 13,702,087.00 |
| ගෘහ භාණ්ඩ | 16,726,593.91 | - | - | 16,726,593.91 | 3,616,172.00 | - | (44,815) | 20,297,950.91 |
| පුස්තකාල පොත් | 2,292,496.39 | - | - | 2,292,496.39 | 57,634.00 | - | - | 2,350,130.39 |
| තිරරෙදි සහ වෙනත් | 1,683,956.00 | - | - | 1,683,956.00 | 175,921.00 | - | - | 1,859,877.00 |
| **එකතුව** | **152,727,618.95** | - | - | **152,727,618.95** | **31,212,052.00** | - | **(431,700)** | **183,507,970.95** |
| **දළ පොත් අගය** | 751,301,351.00 | - | - | 751,301,351.00 | | | - | **793,262,350.00** |
| **සමුච්චනය කළ ක්ෂයවීම්** | 152,727,619.00 | - | - | 152,727,619.00 | | | - | **183,507,971.00** |
| **ශුද්ධ අගය** | **598,573,732.00** | - | - | **598,573,732.00** | | | - | **609,754,379.00** |
| (ප්‍රාග්ධන) නොනිම් වැඩ | 2017.01.01 දිනට ශේෂය | පෙර වර්ෂයේ ගැලපීම් එකතු කිරීම් | අඩු කිරීම් | ගැලපීම්වලට පසු ශේෂය | වසර තුළ එකතු කිරීම් | ගැලපීම් (එකතු කිරීම්) | ගැලපීම් (අඩු කිරීම්) | 2017.12.31 දිනට සත්‍ය අගය රු. |
| නේවාසිකාගාර D,E,H අළුත් වැඩියාව | 3,936,049.00 | | | 3,936,049.00 | **77,779.00** | | (3,936,049) | |
| | | | | | **77,779.00** | - | (3,936,049) | 77,779.00 |
| **ඉදිරියට ගෙන ගිය අගය** | **602,509,781.00** | | **(881,344)** | **(637,938,026)** | | | | **609,832,158.00** |

| | 2016 රු. | 2017 රු. |
|---|---|---|
| **සටහන- 03.1** | | |
| **වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්** | | |
| ලංකා විදුලිබල මණ්ඩලය සමඟ තැන්පතු | 813,750 | 813,750 |
| කාර්ය මණ්ඩල ණය | 899,999 | 1,130,555 |
| | **1,713,749** | **1,944,305** |
| **සටහන- 04.1** | | |
| කෙටිකාලීන ආයෝජන | | |
| ස්ථාවර තැන්පතු මත ආයෝජන | 7,217,379 | 8,014,476 |
| කාර්ය මණ්ඩල ණය | 763,889 | 880,555 |
| | **7,981,268** | **8,895,031** |
| **සටහන - 05** | | |
| ණය ගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂ හා තැන්පතු | | |
| 3501-3512 අයවිය යුතු පාඨමාලා ගාස්තු (උප ලේඛන : 5A) | 2,090,284 | 2,099,723 |
| 3504අයවිය යුතු බාහිර වැඩසටහන් ගාස්තු | 930,359 | 1,341,995 |
| 3513 අයවිය යුතු මුද්‍රණ සේවා ගාස්තු | 40,511 | 135,223 |
| වෙනත් තැන්පතු - ආකෘති 5B) | - | |
| 3514 වෙනත් සේවාවන් සැපයීම වෙනුවෙන් ලැබිය යුතු ගාස්තු | 300,771 | 322,924 |
| 3402කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ අත්තිකාරම් | 2,204,287 | 5,007,472 |
| 3403සැපයුම්කරුවන්ට සැපයුම් | 292,200 | 75,000 |
| 3515 ආයෝජන මත ලැබිය යුතු පොලී | 130,130 | 276,676 |
| 3518 අයවිය යුතු නේවාසික ගාස්තු | 53,750 | 75,000 |
| 3520 අයවිය යුතු නිවාස කුලී | 645,122 | 645,122 |
| 3523 සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් | 239,300 | 138,800 |
| 3524 ආහාර සඳහා කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු මුදල | 5,130 | 11,910 |
| 3525 ආහාර සඳහා සමුපකාර පරීක්ෂකවරුන්ගේ අයවිය යුතු මුදල | 130,896 | 130,896 |
| 3526 ලැබිය යුතු දඩ මුදල් | - | 40 |
| 3527 අයවිය යුතු උත්සව අත්තිකාරම් | 48,300 | 31,250 |
| 3532 කාර්ය මණ්ඩල සඳහා අත්තිකාරම් | - | 9000 |
| 3535 ගිණුම් අතර මාරු කිරීම් | - | - |
| 3539එකතු කළ අගය මත බදු (Vat) | 34,083,330 | 37,622,839 |
| 3540 රඳවා ගැනීම් බදු | 7,321 | 17,505 |
| 3543කාර්ය මණ්ඩලය සඳහා ණය | - | - |
| 3545 අගරු චෙක් පාලන ගිණුම | | |
| 3547 රක්ෂණ ගාස්තු පෙර ගෙවුම් | 671,317 | 340,099 |
| 3548 අයවිය යුතු බස් ගාස්තු | 19,635 | - |
| 3549 අයවිය යුතු ගොඩනැගිලි කුලී | 16,250 | 315,500 |
| 3551 ගෙවත්තෙන් අයවිය යුතු ආදායම් | - | 20,655 |
| 3350 අමාත්‍යාංශය වෙතින් සංවර්ධන නිළධාරී ලැබිය යුතු වැටුප් | | |
| ප්‍රකාශන ගිණුම -ii වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 104,243 | 25,049 |
| **අඩු/අඩමාන ණය සඳහා වෙන් කිරීම්** | **(1,365,267)** | **(1,564,803)** |
| **අඩමාන ණය සඳහා විශේෂ වෙන් කිරීම්** | **(583,616)** | **(566,455)** |
| | **40,064,254** | **46,511,421** |

**සටහන - 06**

**තොග**

| | 2016<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| 3301 ලිපි ද්‍රව්‍ය | 210,063 | 341,582 |
| 3302 මුද්‍රණ ද්‍රව්‍ය | 299,417 | 546,379 |
| 3303 ගොඩනැගිලි ද්‍රව්‍ය | 46,664 | 105,415 |
| 3304 ශ්‍රව්‍ය දෘෂ්‍ය ද්‍රව්‍ය | 6,552 | 6,552 |
| 3305 විවිධ තොග | 299,854 | 370,842 |
| 3306 ප්‍රකාශන - (පොත් හා සටහන්) | 00 | 00 |
| 3306 ප්‍රකාශන - (පොත් හා සටහන්) | 257,956 | 254,974 |
| ප්‍රකාශන ii - මුද්‍රණ ද්‍රව්‍ය තොගය | **14,067** | **14,067** |
| | **1,134,573** | **1,639,811** |

**සටහන - 07**

**<u>බැංකුවේ ඇති මුදල් (මහජන බැංකුව කටුගස්තොට)</u>**

| | | | |
|---|---|---|---|
| ප්‍රකාශන ගිණුම | 0089 1001-92649564 | 259 | 259 |
| අධ්‍යාපන හා පුහුණු ගිණුම | 0089-1001-32648143 | 14,071,329 | 16,269,659 |
| එලදායිතා ගිණුම | 089-1001-38092-967 | 238,856 | 238,856 |
| රජයේ ගිණුම | 0089-1001-92648140 | 76,218,338 | 49,815,997 |
| සේවා ගාස්තු ගිණුම | 0089-1001-5000-2158 | 703,803 | 437,620 |
| ආයතනික අරමුදල | 089-2001-90030993 | 2,898,613 | 3,030,555 |
| ප්‍රකාශන ගිණුමii | 089-1001-50018442 | 360,296 | 399,407 |
| | | **94,491,494** | **70,192,353** |

**සටහන - 08**

**<u>ප්‍රාග්ධනය</u>**

| | | |
|---|---|---|
| 01.01 දිනට ශේෂය | 233,254,215 | 233,254,215 |
| **<u>එකතු කිරීම්/ අඩු කිරීම්: ගැලපුම්</u>** | - | |
| | **233,254,215** | **233,254,215** |

**සටහන - 09**

**<u>සමුච්චිත ලාභ/(පාඩු)</u>**

| | | |
|---|---|---|
| 01. 01 දිනට ශේෂය | (83,517,777) | (86,059,589) |
| **<u>එකතු කිරීම්/ අඩු කිරීම් : පෙර වර්ෂයේ ගැලපීම්</u>** | | |
| විගණන ගාස්තු | | |
| වෙනත්- එකතු කිරීම් | 2,011,074 | - |
| වෙනත්- අඩු කිරීම් | (881,344) | - |
| | 1,129,730 | - |
| **පෙර වර්ෂයේ ගැලපීම්වලට පසු සමුච්චිත ලාභ/(පාඩු)** | **(82,388,046)** | **(86,059,589)** |
| එකතුකලා : ආදායම ඉක්මවා ඇති වියදම් | (3,671,541) | 2,509,280 |
| | (3,671,541) | 2,509,280 |
| | **(86,059,588)** | **(83,550,308)** |

**සටහන - 10**

| | 2016<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| **භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන** | | |
| 01.01. දිනට ශේෂය | 457,571,859 | 445,505,844 |
| එකතු කිරීම්/අඩු කිරීම් | - | - |
| | **457,571,859** | **445,505,844** |
| එකතු කලා : වර්ෂය තුල ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | 13,000,000 | 8,000,000 |
| | **47,571,859** | **453,505,844** |
| අඩු කලා : ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලදී ගත් වත්කම්වල ක්ෂයවීම් | (25,066,015) | (25,875,850) |
| | **445,505,844** | **427,629,994** |

**සටහන - 11**

**අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන**

| | | |
|---|---|---|
| 01.01 දිනට ශේෂය | 29,320,091 | 29,323,029 |
| එකතුකලා : වර්ෂය සඳහා ලැබීම් | 2,938 | 750 |
| | 29,323,029 | 29,323,779 |
| අඩු කලා : ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලදී ගත් වත්කම්වල ක්ෂයවීම් | (13,464,593) | (13,849,435) |
| | **15,858,435** | **15,474,343** |

**සටහන - 12**

**ණය හිමියන් සහ උපචිත වියදම්**

| | | |
|---|---|---|
| 4001 දුරකථන ගාස්තු | 74,710 | 114,330 |
| 4002 ජල ගාස්තු | 73,975 | - |
| 4003 විදුලි ගාස්තු | 138,355 | 119,702 |
| 4004 දේශන ගාස්තු | 500,500 | 1,009,138 |
| 4005 වෙනත් උපචිත වියදම් | 511,154 | 664,125 |
| 4008 යැපීම් දීමනා පාලක ගිණුම් | 72,450 | 72,450 |
| 4015 ගෙවිය යුතු රජයේ විගණන ගාස්තු | 550,000 | 844,925 |
| 4016 භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු මුදල් | 85,822 | 275,738 |
| 4018 බාහිර වැඩසටහන් සඳහා අත්තිකාරම් ලැබීම් | 548,119 | 86,937 |
| 4019 ආරක්ෂක සේවා ගෙවීම් | 398,351 | 447,510 |
| 4020 සනීපාරක්ෂක හා පවිත්‍රතා සේවා ගාස්තු | 389,180 | 1,195,654 |
| 4021 රෙදි සේදීමේ සේවාව | | 1,150 |
| 4022 ගොඩනැගිලි ඉදිකිරීම්- CECB | 45,726,029 | 47,374,205 |

| | 2016<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| ආකෘතිය : **12A අනුව) අත්තිකාරම් ලැබීම්** | 3,870,733 | 1,487,715 |
| 4027 ණයහිමි ගෙවීම් | 767,400 | 135,364 |
| 4028 බස්රථ කුලී සඳහා අත්තිකාරම් ලැබීම් | 1,000 | - |
| 4035 වැටුප් පාලන ගිණුම (අනියම් සේවකයින්) | 100,247 | 86,733 |
| 4040 ආපසු ගෙවිය යුතු පාඨමාලා ගාස්තු | 142,000 | 75,750 |
| 4041 එලදායිතා පාලන ගිණුම | 238,856 | 238,856 |
| 4060 රසපිරි කේටර්ස් | 2,280 | 211,988 |
| 3902 ආරක්ෂිත තැන්පතු | 1,478,322 | 637,063 |
| 4043 වැට් බද්ද | 2,500,286 | 3,046,968 |
| 3903 ටෙන්ඩර් තැන්පතු | 91,350 | 192,650 |
| 3907 පුස්තකාල තැන්පතු | - | - |
| 4058 වන්දි සඳහා වෙන් කිරීම | 217,200 | - |
| 4048 රුචිර කේටරස් වෙත ගෙවිය යුතු | | 9,204 |
| 4049 ගෙවිය යුතු ඉන්ධන ගාස්තු | 57,024 | 67,490 |
| 4053 කලින් ලැබූ ගොඩනැගිලි කුලී ආදායම | - | - |
| 4052 සතොස ආර්ථික සේවා (පුද්) සමාගමට දිය යුතු ආහාර ගාස්තු | 150,000 | - |
| 4057 මහජන බැංකුවෙන් ලද අත්තිකාරම් | 975,000 | 440,253 |
| 4056 ශ්‍රවනාගාර ගොඩනැගිල්ල සඳහා සමු. අරමුදලෙන් ලද අත්තිකාරම් | - | - |
| 4059 ප්‍රකාශන අලෙවිය මත AAT ආයතනයවෙත ගෙවිය යුතු මුදල් | - | 17,408 |
| 4061 ප්‍රයෝජනයට නොගත් 2015 වසරේ පුනරාවර්තන ප්‍රතිපාදන | 175,738 | 543,744 |
| 4061 NBT | 75,986 | 171,643 |
| 4063 කලින් ලැබූ නේවාසිකාගාර ආදායම | | 794,925 |
| 4064 උපදේශන ගාස්තු | | 60,635 |
| ප්‍රකාශන ගිණුම - ii ණය හිමියෝ සහ උපචිත වියදම් | 83,170 | 108,345 |
| | **59,995,237** | **60,532,595** |

**සටහන - 13**

**<u>පුනරාවර්තන ප්‍රදානයන් (කේත අංක :11)</u>**

| | | |
|---|---|---|
| 1021 භාණ්ඩාගාරයෙන් ලැබු ප්‍රතිපාදන | 29,409,001 | 30,610,443 |
| 1020 අමාත්‍යාංශයෙන් | - | - |
| 1044 සමුපකාර අරමුදලින් ලැබූ ප්‍රතිපාදන | 816,738 | 534,747 |
| | **30,225,739** | **31,145,190** |

**සටහන - 14**

**අනෙකුත් ආදායම් (කේත අංක : 11)**

| | 2016 රු | 2017 රු |
|---|---|---|
| 1001 - 1011 පාඨමාලා ගාස්තු - ආකෘති 14 - A | 11,869,978 | 16,673,912 |
| 1012 කාමර ගාස්තු | 6,773,300 | 6,777,377 |
| 1014 දේශන ශාලා ගාස්තු | 1,879,275 | 2,100,000 |
| 1014 ශ්‍රවනාගාර අදායම | 3,533,500 | 4,680,009 |
| 1015 නිවාස කුලී | 367,865 | 401,446 |
| 1017 ප්‍රකාශන විකුණුම් ආදායම් | 1,925 | 7,636 |
| 1018 සේවා ගාස්තු | 48,975 | 128,900 |
| 1023 මුද්‍රණ සේවා | 9,812 | 102,234 |
| 1024 පුස්තකාල ගාස්තු | 62,500 | 55,500 |
| 1025 විභාග ගාස්තු | 133,464 | 151,537 |
| 1026 ස්ථාවර තැන්පතු පොලී | 281,863 | 504,360 |
| 1027 කාර්ය මණ්ඩල ණය සඳහා පොලි | 76,571 | 88,290 |
| 1035 ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 145,372 | 188,922 |
| ආවස්ථික පිරිවැය සහණදායි ණය පොලි | 137,066 | 161,889 |
| 1036 ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | 45,784 | 234,125 |
| විවිධ ආදායම්- (ආකෘති 14-B) | 1,727,901 | 1,922,414 |
| 1043 ආහාර සැපයීමේ කොමිස් | 924,298 | 697,696 |
| 1069 ගොඩනැගිලි කුලී | 442,500 | 811,500 |
| 1063 NBT | | 279,418 |
| 1083 ඵලදායිතා පාලන ගිණුම | 966,0007 | - |
| 1085 නොගෙවූ වන්දි | | 217,200 |
| අඩමාන ණය සදහා අඩි වෙන්කිරීම් | 61,188 | - |
| | **29,489,144** | **36,184,366** |

**සටහන - 15**

**සේවක පිරිවැය (කේත අංක : 01)**

| | 2016 රු | 2017 රු |
|---|---|---|
| 101 වැටුප් හා වේතන | 21,867,594 | 20,919,231 |
| 151 දේශන ගාස්තු | 3,014,875 | 4,070,849 |
| 103 අතිකාල දීමනා | 391,425 | 181,807 |
| 104 දීමනා | 2,009,284 | 1,395,048 |
| 105 සේවක අර්ථ සාධක අරමුදල (ආයතන දායකත්වය) | 2,284,068 | 2,448,617 |
| 106 සේවක භාරකාර අරමුදල් දායකත්වය | 456,814 | 489,723 |
| 153 විභාග අධීක්ෂණ ගාස්තු | 147,750 | 119,800 |
| 154පාඨමාලා සම්බන්ධිකරණ ගාස්තු | 167,437 | 299,004 |
| 110 කළමනාකරණ මණ්ඩල සහභාගිත්වදීමනා | 216,000 | 120,000 |
| 112 නිවාඩු දින වැටුප් හා අනෙකුත් | 71,859 | 61,278 |
| 115 විගණන කමිටු දීමනා | 90,000 | 72,000 |
| 155 ප්‍රශ්න පත්‍ර සැකසීමේ ගාස්තු | 141,663 | 135,670 |
| 156 පිළිතුරු පත්‍ර බැලීමේ ගාස්තු | 406,640 | 414,200 |
| 118 විශ්‍රාම පාරිතෝෂික දීමනා | 1,229,551 | 1,600,338 |
| 119 විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායකත්වය | 132,576 | 212,271 |
| 158 උපදේශන ගාස්තු | 103,500 | 129,360 |
| 159 පාඨමාලා පරිපාලන ගාස්තු | 7,700 | 80,965 |
| සහනදායී ණය මත සේවාදායකයින්ගේ ප්‍රතිලාභ | 137,066 | 161,889 |
| | **32,875,799** | **32,912,050** |

**සටහන - 16**

**ගමන් වියදම් (කේත අංක :02)**

| | 2016 රු | 2017 රු |
|---|---|---|
| 201 දිවයින ඇතුලත රාජකාරි ගමන් ගාස්තු | 140,038 | 112,491 |
| 202 විදේශීය ගමන් ගාස්තු | 359,632 | 234,664 |
| | **499,670** | **347,155** |

| සටහන -17 | 2016 රු | 2017 රු |
|---|---|---|
| **සැපයුම් හා කාර්යාලීය අවශ්‍යතා (කේත අංක : 03)** | | |
| 301 ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 532,565 | 480,719 |
| 302 ඉන්ධන සහ ලිහිසි තෙල් | 1,557,465 | 1,392,715 |
| 303 මුද්‍රණ ද්‍රව්‍ය | 327,010 | 461,889 |
| 304 පුවත් පත් සහ වාර සඟරා | 52,380 | 39,260 |
| 306 ආහාර වියදම් | 728,608 | 1,315,834 |
| 307 යාන්ත්‍රික හා විදුලි උපකරණ | 76,744 | 104,712 |
| 308 වීඩියෝ කැසට් සහ වෙනත් | 5,292 | - |
| 310 වෙනත් සැපයුම් | 423,460 | 622,550 |
| 313 වතුර බෝතල් පිරිවැය | 152,843 | 80,820 |
| 314 ප්‍රකාශන මිලදී ගැනීම් | - | - |
| | **3,856,367** | **4,498,499** |

| සටහන - 18 | | |
|---|---|---|
| **නඩත්තු වියදම් (කේත අංක :04)** | | |
| 401 රථවාහන | 532,861 | 437,197 |
| 402 යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 132,528 | 263,484 |
| 403 ගොඩනැගිලි | 129,911 | 160,752 |
| 404 ගෘහ භාණ්ඩ | - | 43,295 |
| 405 පරිගණක උපාංග | | 1,210 |
| 406 රථවාහන බලපත්‍ර හා රක්ෂණ | 61,306 | 75,255 |
| 407 තිර රෙදි හා ඇතිරිලි | - | - |
| | **856,605** | **981,193** |

| සටහන -19 | | |
|---|---|---|
| **ගිවිසුම්ගත ගත සේවා (කේත අංක : 05)** | | |
| 501 ප්‍රවාහන | 1,168,418 | 1,622,544 |
| 502 දුරකථන ගාස්තු | 953,968 | 1,035,512 |
| 503 තැපැල් ගාස්තු | 332,410 | 228,730 |
| 504 විදුලිය | 3,893,135 | 2,840,133 |
| 505 ජලය | 1,040,978 | 638,027 |
| 511 කුලී ගාස්තු | 42,149 | 22,649 |
| 508 විගණන ගාස්තු | 186,000 | 294,925 |
| 510 දැන්වීම් ප්‍රචාරණය | 473,778 | 922,963 |
| 512 ආරක්ෂක සේවා | 3,988,672 | 4,768,250 |
| 513 සනීපාරක්ෂක සේවා | 4,562,239 | 4,395,188 |
| 514 ඇපුල්ලුම් සේවා | 272,220 | 295,010 |
| 515 ගෙවතු පවිත්‍ර කිරීම් | 171,750 | 39,477 |
| 516 රක්ෂණය | 629,286 | 695,791 |
| 517 පරිවර්වර්ථන ගාස්තු | 87,360 | 44,031 |
| 520 සේවක පුහුණුව (දේශීය/විදේශීය) | 6,000 | 65,000 |
| 521 සාමාජික ගාස්තු | 457,300 | 556,968 |
| 523 අනෙකුත් සේවා | 257,775 | 228,235 |
| 524 මුද්‍රණ ගාස්තු මුද්‍රණ අංශය | 500,698 | 251,587 |
| 525 මුද්‍රණ ගාස්තු - ශ්‍රව්‍ය දෘෂ්‍ය | 102,000 | 24,000 |
| 526 මුද්දර ගාස්තු | 950 | - |
| 530 ශාලා ගාස්තු | 16,518 | - |
| 531 නවාතැන් ගාස්තු | 115,740 | 139100 |
| **එකතුව** | **19,259,345** | **19,108,120** |

| සටහන -20 | 2016 රු. | 2017 රු. |
|---|---|---|
| **වෙනත් වියදම් (ක්ෂේත අංක :06)** | | |
| 519 නිළ ඇඳුම් දීමනා | - | - |
| 532 නිළ නිවාස කුලී ආපසු ගෙවීම | 136,924 | - |
| 601 හා 602 නීති ගාස්තු හා පරිත්‍යාග | 88,500 | 63,000 |
| 605 වන්දි | - | - |
| 607 සංග්‍රහ වියදම් -අමුත්තන් සඳහා | 912,217 | 444,562 |
| 607 සංග්‍රහ වියදම් -ශ්‍රවණාගාරය විවෘත කිරීමේ උත්සවය | - | - |
| 703 බැංකු ගාස්තු | 17,775 | 34,169 |
| 705 කාර්ය මණ්ඩලය සඳහා වු ණය මත පොලී | - | - |
| 707 ජාතිය ගොඩනැගීමේ බදු | 127,598 | 914,961 |
| 709 ණය ගැතියන් සඳහා බොල් ණය වෙන්කිරීම් | - | 182373 |
| 710 ආයතනික අරමුදලට දායකත්වය | 305,895 | 279,138 |
| පොත් තොග කපා හැරීම | 32,950 | - |
| 713 හුවමාරු පාඩු | 1,262 | - |
| | **1,623,121** | **1,918,204** |

**සටහන :12-A**

| කලින් ලැබු පාඨමාලා ගාස්තු | | |
|---|---|---|
| 4023 සමුපකාර ඩිප්ලෝමා පාඨමාලා | 3,138,382 | 1,381,280 |
| 4024 වැඩමුළු | 655,214 | - |
| 4025 වෙනත් පාඨමාලා | 77,137 | 106,435 |
| | **3,870,733** | **1,487,715** |

**සටහන: 14-A**

| පාඨමාලා ගාස්තු ආදායම් | | |
|---|---|---|
| 1001 සමුපකාර උසස් ඩිප්ලෝමා පාඨමාලා | 3,361,300 | 4,069,254 |
| 1001- වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා | | 485,000 |
| 1002 NICD පරිගණක ඩිප්ලෝමාව | 640,600 | 493,825 |
| 1003 පරිගණක සහතික පත්‍ර පාඨමාලාව | 949,899 | 924,750 |
| 1004 ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාව | 423,750 | 438,060 |
| 1005 විශේෂ පාඨමාලා | | |
| 1005 -01 පාඨමාලා ගාස්තු ගණකාධිකරණ ශිල්පීය ආයතනය | 643,225 | 859,725 |
| 1005 -02 පාඨමාලා ගාස්තු වරලත් ගණකාධිකරණ | 399,310 | 1,710,345 |
| 1005 -03 පාඨමාලා ගාස්තු කළමනාකරණ ගණකාධිකාරී සහතිකපත් | 3,100 | - |
| 1005 -03 පාඨමාලා ගාස්තු බැංකුකරුවන්ගේ බැංකු හා මූල්‍ය සහතිකපත් | 78,900 | - |
| 1006 තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව | 214,500 | - |
| 1007 සමුපකාර සහතික පත්‍ර පාඨමාලාව | 1,242,616 | 2,121,228 |
| 1008 කෙටිකාලීන වැඩමුළු | 2,159,039 | 3,356,410 |
| 1009 පරිගණක කෙටිකාලීන පාඨමාලා | 691,070 | 598,170 |
| 1010 කෙටිකාලීන පාඨමාලා - බාහිර ඉල්ලීම් මත | 1,062,669 | 1,617,146 |
| 1072 දෙමළ සහතික පත්‍ර පාඨමාලාව | - | |
| | **11,869,978** | **16,673,912** |

| **සටහන: 14-B** | **2016** රු. | **2017** රු. |
|---|---|---|
| **වෙනත් ආදායම්** | | |
| 1016 ගෙවතු ආදායම | 38,496 | 88,800 |
| 1034 නේවාසික කළමනාකාර ගාස්තු | 80,399 | 45,300 |
| 1038 ඡායා පිටපත් ගාස්තු | 6,132 | - |
| 1040 උපකරණ කුලියට දීම | 623,843 | 212,801 |
| 1041 වෙනත් සැපයුම | - | |
| 1044 වතුර බෝතල් | 267,055 | 140,285 |
| 1045 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 77,865 | 101,304 |
| 1046 ඡායා රූප ආදායම | 8,800 | - |
| 1047 දඩ මුදල් | 42,232 | 1,109,024 |
| 1048 පොත් බැඳීම | 100 | 100 |
| 1051 වෙනත් ආදායම් | 71,909 | 10,379 |
| 1056 බස් රථයේ ආදායම් | 326,130 | 84,065 |
| 1061 අතිරේක ආදායම් | 106,529 | 8,990 |
| 1062 නොඉල්ලූ ගෙවිය යුතු මුදල් | | 53,750 |
| 1080 AAT ප්‍රකාශන කොමිස් මුදල් | 41,152 | 11,320 |
| 1071 පුවත්පත් අලෙවිය | 9,635 | - |
| 1079 මෘදුකාංග සංවර්ධන කොමිස් | - | - |
| 1082 රැඳවුම් මුදල් | 27,623 | 56,297 |
| | **1,727,901** | **1,922,414** |

# විගණකාධිපති වාර්තාව -2017

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සීඑල්පී/කේඩී/අයි/එන්අයිසීඩී/01/17/36

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් 27 දින

National Institute of Co- operative Development
★ 10 OCT 2018 ★
Polgolla
Sri Lanka

සභාපති,

ජාතික සමූපකාර සංවර්ධන ආයතනය,

**ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 අගෝස්තු 14 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ප්‍රමිතයේ 31 ඡේදය ප්‍රකාරව 2001 වර්ෂයෙන් පසු ඉඩම් හා ගොඩනැගිලි සඳහා ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණු බැවින් එම වත්කම් සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.30,980,000 ක්වූ ප්‍රදානයෙන් වර්ෂය තුලදී වියදම් කරන ලද රු.30,610,443 ක් පමණක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබුණු අතර වියදම් නොකරන ලද රු.369,557 ක මුදල ගෙවිය යුතු යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ගොඩනැගිලි අලුත්වැඩියා වෙනුවෙන් ගෙවිය යුතු රු.247,226 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ සඳහා ගැලපිය යුතු නීතිඥ ගාස්තු රු.66,000 ක් සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.746,737,795 ක් වූ ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් වත්කම් ලේඛන හා උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 6 ක එකතු වටිනාකම රු.4,675,883 ක් වූ අතර, ඒ තුළ වසර 1 ත් වසර 5 ත් අතර කාලයක පැවති ශේෂ එකතුව රු.3,189,691 ක් හා වසර 5 ට වඩා වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකල ශේෂවල එකතුව රු.1,486,192 ක් විය.

(ආ) ආයතනය සතු බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමරයක් සමූපකාර කෝප්සිටි වෙළඳසැලට බදු දී තිබුණු අතර එම කඩ කාමරය වෙනුවෙන් 2017 මාර්තු සිට අගෝස්තු දක්වා තක්සේරුගත කුලිය රු.237,895 ක් ලැබිය යුතුව තිබුණි.

(ඇ) 2005 වර්ෂයේ සිට අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවති දේශීය අදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වැට් බදු ශේෂය රු.37,622,639 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කරගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 5 ක එකතු වටිනාකම රු.75,513,623 ක් වූ අතර, ඒ තුළ වසර 1 ත් වසර 5 ත් අතර කාලයක සිට නිරවුල් නොකල ශේෂ එකතුව රු.28,139,418 ක් හා වසර 5 ක කාලයක් ඉක්මවා නිරවුල් නොකල ශේෂයන්හි එකතුව රු.47,374,205 ක් වී තිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල් රෙගුලාසි 757(2) හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 වන වගන්තිය | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2006 ජූලි 14 දිනැති හා අංක 11/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 3(iv) ඡේදය | සභාපතිවරයා වෙත වෙන්කර තිබූ කැබ් රථය සඳහා 2017 වර්ෂයේ ඉන්ධන ලීටර් 2040 ක් භාවිතා කර ඇතත්, ගමන් පිළිබඳ මාසිකව සාරාංශ ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,509,280 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,671,542 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,180,822 ක වර්ධනයක් විය. සමාලෝචිත වර්ෂයේ ආදායම රු.7,708,790 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.706,772 ක්වූ ඌනතාවය 2014 වර්ෂයේදී තවදුරටත් පිරිහී රු.5,786,120 ක්වී තිබුණද, 2015 වර්ෂයේදී රු.1,156,557 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. නැවත 2016 වර්ෂයේදී රු.3,671,542 ක ඌනතාවයක් බවට පත්වී තිබුණද 2017 වර්ෂයේදී රු.2,509,280 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.10,033,116 ක් වූ දායකත්වය 2015 වර්ෂයේ රු.33,845,710 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී නැවත 2016 වර්ෂයේ දී රු.26,806,656 ක් දක්වා පිරිහී තිබුණද 2017 වර්ෂයේදී රු.33,721,332 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර පුද්ගලයන් තිදෙනෙකු විසින් නැවත සේවය ලබා ගැනීම හා වන්දි ලබා ගැනීම සම්බන්ධව ආයතනයට එරෙහිව අධිකරණයේ නඩු තුනක් ගොනුකර තිබුණි.

(ආ) මෙම ආයතනයේ සේවය කර විශ්‍රාම ගොස් මියගොස් ඇති නිලධාරියෙකු ආයතනය සතු රජයේ නිවාසයක පදිංචි වී සිටි කාලය වෙනුවෙන් ලැබිය යුතු රු.425,406 ක් වූ නිවාස කුලිය හා ඊට අදාළ පොළිය අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතනය විසින් වන්දි ඉල්ලා නඩුවක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංයුක්ත සැලැස්ම 2013 - 2017 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබුණද, එම සැලැස්මෙහි අධ්‍යයන කටයුතු වලට අදාළ අරමුණු පමණක් ඇතුළත් කර තිබුණි. එසේම එම අරමුණු සඳහා පවතින ශක්තීන් පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත් කර තිබුණද, දුර්වලතා පිළිබඳ හඳුනා ගැනීමක් සිදුවී නොතිබුණි.

(ආ) (i) වාර්ෂික අයවැය ලේඛනයෙහි සංවර්ධන වියදම් සඳහා දරන සම්පූර්ණ වියදම දක්වා තිබුණද, ඒ ඒ ව්‍යාපෘති සඳහා දරන වියදම් වෙන් වෙන් වශයෙන් දක්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණු අතර, ආයතනයේ නිලධාරීන් 33 දෙනෙකු අතරින් නිලධාරීන් හත් දෙනෙකු පමණක් සමාලෝචිත වර්ෂය තුළදී දින 07 ක් බාහිර පුහුණු වැඩසටහන් සඳහා යොමුකර තිබුණි.

(iii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කළ යුතු ණය ආපසු ගෙවීමේ සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණු අතර, සමූපකාර අරමුදලින් ලබාගත් රු.25,000,000 ක ණය මුදල ගෙවීමට කටයුතුකර නොතිබුණි.

(iv) වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම, වාර්ෂික අයවැය ලේඛනය සමඟ සැසඳිය හැකි පරිදි පිළියෙල කර නොතිබුණු අතර ඒ හේතුවෙන් අයවැය ඇස්තමේන්තුවල ප්‍රමාණවත්භාවය හඳුනා ගැනීමට නොහැකි විය.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) සමූපකාර සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය සඳහා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කළ යුතු වුවත්, මෙම ආයතනය මගින් සමූපකාර සහතිකපත්‍ර පාඨමාලාව හා සමූපකාර ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම පමණක් කාල ප්‍රමාදයන් සහිතව සිදුකර තිබුණි.

(ii) නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් සමූපකාර සංවර්ධනය පිළිබඳව පුහුණුව සැපයිය යුතු වුවත්, නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගැනීමකින් තොරව සාම්ප්‍රදායික ඉගැන්වීමේ ක්‍රමයට පාඨමාලා පවත්වා තිබුණි.

(iii) සමූපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ කිසිදු පර්යේෂණයක් සිදුකර නොතිබුණු අතර, පර්යේෂක හා සහාය පර්යේෂක යන තනතුර සමාලෝචිත වසර තුළ පුරප්පාඩුව පැවතුණි.

(iv) කළමනාකරණ නිපුණතා අවශ්‍ය වන සමූපකාර ව්‍යවසායන් භාරගෙන කළමනාකරණය කළයුතු වුවත්, එම අරමුණ කෙරෙහි කිසිදු අවධානයක් යොමු කර නොතිබුණු අතර, ලංකාවේ සමූපකාර ව්‍යවසායන් පිළිබඳ පරීක්ෂාවේදී පළාත් 7 ක සමූපකාර සමිති 9951 කින් සමිති 5996 ක් පමණක් ක්‍රියාකාරී මට්ටමේ පැවති අතර, සමිති 3955 ක් අක්‍රීය මට්ටමේ පැවතුණු බව නිරීක්ෂණය විය.

(v) සමූපකාර ව්‍යවසායවලට වෘත්තීය උපදෙස් ලබා දීම සිදුකළ යුතු වුවද, එවැනි උපදෙස් ලබා දීමක් සිදුකර නොතිබුණි.

(vi) ආදර්ශ සමූපකාර ගම්මාන හා වෙළඳ මධ්‍යස්ථාන පිහිටුවීම සිදුකළ යුතු වුවත්, 2013 වර්ෂයේදී කිරි ගම්මාන ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාත්මක කර තිබුණද, එය ක්‍රියාකාරී නොවූ අතර, මෙම අරමුණු කෙරෙහි ඉහළ කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) 2001 අංක 01 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 13 වන වගන්තිය අනුව පුහුණු සහ පර්යේෂණ වැඩසටහන් සැකසීම හා ආයතනය පවත්වන පාඨමාලා සඳහා විෂයමාලා සහ කරුණු සංවර්ධනය කිරීම යන කාර්යයන් ඉටු කිරීමට ආයතනයේ අධ්‍යයන මණ්ඩලය පියවර ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් පවත්වා තිබුණු පුහුණු පාඨමාලා සහ උපකාරක වැඩ සටහන්වල ප්‍රගතිය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

(i) සමාලෝචිත වර්ෂයේදී කෙටි කාලීන පුහුණු පාඨමාලා 21 ක් පැවැත්වීමට අපේක්ෂා කළද සත්‍ය ලෙස පවත්වා තිබුණේ පාඨමාලා 19 ක් පමණි.

(ii) පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා ලැබී තිබුණු මහජන බැංකු ප්‍රදානවලින් රු.440,253 ක් ඉතිරි වී තිබුණද සමාලෝචිත වර්ෂය තුළ මහජන බැංකු ආධාර යටතේ පුහුණු වැඩසටහන් ආරම්භ කිරීමට සැලසුම් කර නොතිබුණි.

(iii) ඉකුත් වර්ෂවලදී සමුපකාර ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නොමිලයේ පාඨමාලා පවත්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දී එසේ පාඨමාලා පැවැත්වීම අතහැර දමා තිබුණි.

(ඈ) ආයතනයේ වෘත්තීය පුහුණු මාර්ගෝපදේශය අනුව පිළියෙල කල යුතු කාර්යසාධන දර්ශක පිළියෙල කර නොතිබීම හේතුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි අඩංගු කාර්යයන් සම්බන්ධයෙන් ඒවායේ නිමැවුම් මට්ටම මැනීමට නොහැකි විය.

(ඉ) 2017 සහ 2018 පුහුණු මාර්ගෝපදේශය අනුව සමුපකාර පර්යේෂණ කටයුතු සිදු කිරීම අරමුණු කර ගනිමින් පර්යේෂණ අංශයක් අධ්‍යයන අංශයට සම්බන්ධ කර ස්ථාපිත කිරීමට අපේක්ෂා කර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) ශ්‍රව්‍ය දෘශ්‍ය අංශයේ ආදායම 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.833,501 සිට රු.152,360 ක් දක්වා පහත වැටී තිබුණි. ආයතනය විසින් පාඨමාලා 65 ක් පවත්වා තිබුණද නවීන උපකරණ වලින් සමන්විත ශ්‍රව්‍ය දෘශ්‍ය අංශය 2017 වර්ෂය තුළදී ආයතනික පුහුණු අවශ්‍යතා වෙනුවෙන් භාවිතයට ගෙන තිබුණේ පාඨමාලා 4 ක් සඳහා පමණි.

(උ) 2017 වර්ෂයේදී රු.1,786,500 ක් ඉපයීමේ අපේක්ෂාවෙන් සැලසුම් කළ කෙටිකාලීන හා වෘත්තීය පුහුණු පාඨමාලා 9 ක් පවත්වා නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම ආයතනය පවත්වන වෘත්තීය පුහුණු පාඨමාලාවලට සහභාගිවන පුහුණුලාභීන් ප්‍රමාණය ඉතා අඩු බැවින් පුළුල් ප්‍රචාරණයක් ලබාදීම තුලින් පුහුණුලාභීන් ප්‍රමාණය වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනය සතු සංචාරක නිවාසය 2014 වර්ෂයේදී රු.16,000,000 ක වියදමක් දරා සුඛෝපභෝගී ආකාරයට වැඩි දියුණු කර ඇමතිවරුන් සහ ඔවුන්ගේ කාර්යය මණ්ඩලයට පමණක් වෙන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී උපයා තිබූ ආදායම රු.29,965 ක් පමණක් වූ අතර, වර්ෂ 2013 සිට 2017 දක්වා වර්ෂ 5 තුළ ආදායම ක්‍රමයෙන් රු.588,595 ක සිට රු.29,965 ක් දක්වා අඩු වී තිබුණි.

(ඇ) P - 12 දරන රජයේ නිවාසය වර්ෂ 11 ක පමණ කාලයක් ගිවිසුමකින් තොරව සී/ස මහවැලි සමූපකාර සමිතියට ලබා දී කුලී අය නොකිරීම හේතුවෙන් රු.187,200 ක තක්සේරුගත ආදායම රජයට අහිමි වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 හා 2009 වර්ෂවල පවත්වා තිබුණු ඵලදායිතා තරඟාවලිය සඳහා විවෘත කර තිබුණු බැංකු ගිණුමේ 2007 වර්ෂයේ සිට පැවත එන ශේෂය රු.238,855 ක් වසර 10 ක කාලයක් තුළ කිසිදු ඵලදායී කාර්යයකට යොදා නොගෙන බැංකු ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පැවැත්වීමට අපේක්ෂිත එක් එක් පාඨමාලාවලට සහභාගී කරගත යුතු පුහුණුලාභීන් ප්‍රමාණය තීරණය කිරීමෙන් තොරව පුහුණු මාර්ගෝපදේශය සකස් කර තිබුණි.

(ඇ) 2017 වර්ෂයේ අයවැය අනුව නවීන පහසුකම් වලින් සමන්විත ශ්‍රවනාගාරයෙන් රු.5,616,000 ක ආදායමක් ඉපයීමට සැලසුම් කර තිබුණද, අවස්ථා 17 ක දී රු.4,968,750 ක් පමණක් උපයාගෙන තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2015 වර්ෂයේ නිල නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලැබුණු රු.7,000,000 ක ප්‍රතිපාදනය පුස්තකාලය අලුත්වැඩියා කිරීමට උපයෝජනය කර තිබුණි.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී ආයතනයේ පුහුණු පාඨමාලාවල ප්‍රමිතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණ රු.6,000,000 කින් රු.3,498,291 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවීමකින් තොරව ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) ආයතනයේ ශ්‍රවනාගාරය ඉදිකිරීම වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවලදී ලැබුණු රු.68,445,000 ක මුදලින් රු.38,445,000 ක් වැය නොකර 2017 දෙසැම්බර් 31 දක්වා ජංගම ගිණුම තුළ රඳවාගෙන තිබුණි.

**4.6 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ අංක B-13 දරන පැරණි ගොඩනැගිල්ලේ කාර්යාල කාමර 7 ක් 2008 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණු අතර, අධ්‍යක්ෂ ජනරාල් නමින් උපලේඛනගත වූ රජයේ නිවාසය 2015 ජනවාරි 05 දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා ප්‍රයෝජනයට නොගැනීම නිසා රජයට රු.214,027 ක තක්සේරුගත නිවාස කුලී ආදායමක් අහිමි වී තිබුණි. අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ සේවය සඳහා ද්විතීය පදනම මත නිලධාරීන්ගේ බඳවා ගැනීම මේ සඳහා හේතු වී ඇති බව විගණනයේදී අනාවරණය විය.

(ආ) ආයතනය සතු රජයේ නිවාස 3 ක් 2012 සිට 2017 වර්ෂය දක්වා ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණු අතර, රු.270,850 ක තක්සේරුගත ආදායම අහිමි වී තිබුණි.

(ඇ) බහුකාර්ය ගොඩනැගිල්ලේ ස්ථාපිත කර තිබූ සමුපකාර කෝප්සිටි වෙළඳසැල 2017 සැප්තැම්බර් මාසයේ සිට වසා දමා නිෂ්කාර්යව පැවති අතර, බාහිර පාර්ශවයකට බදු දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.240,000 ක තක්සේරුගත ආදායමක් අහිමි වී තිබුණි.

## 4.7 හඳුනා ගන්නා ලද පාඩු

2014 ජූනි 01 දින අනතුරට ලක් වූ ආයතනය සතු මෝටර් රථයක් යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගේ පරීක්ෂාවකින් තොරව හා අලුත්වැඩියාව පිළිබඳ ඇස්තමේන්තුවක් ලබා නොගෙන රු.247,332.50 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණි. එසේ වුවද, අනතුරින් පසු අලුත්වැඩියාව නිසි පරිදි සිදුකර නොතිබීම හේතුවෙන් කිලෝමීටර 1332 ක් පමණක් ධාවනය කිරීමට හැකිව තිබුණු අතර, ඉන්පසු භාවිතයට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි. ඉහත අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) අනුව අලාභහානි සිදු වූ දින සිට තෙමසක් තුළ පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 ජූනි 29 දින වන විටත් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

## 4.8 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් / දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

මුදල් රෙගුලාසි 315(1) ප්‍රකාරව ආයතනය පිහිටි අක්කර 26 ක භූමිය පවරා ගෙන නොතිබුණු අතර මෙම ආයතනය භූමිය යාබද ඉඩම් හිමියන් විසින් අනවසරයෙන් අල්ලා ගෙන තිබුණි. මෙම වත්කම් සුරක්ෂිත කිරීම හා ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

## 4.9 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත තනතුරු 16 ක පුරප්පාඩු 36 ක් පැවති අතර, එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටද කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) තනතුරු දෙක සඳහා ස්ථිර නිලධාරීන් පත්කර ගැනීමට බලධාරීන්ගේ අවධානය යොමු කිරීමෙන් තොරව 2001 වර්ෂයේ සිට ද්විතියික පදනම මත නිලධාරීන් බඳවා ගැනීම හේතුවෙන් ආයතනයේ දැක්ම වන තිරසාර පැවැත්මක් සහිත නිර්මාණශීලී හා නව්‍යකරණයෙන් යුත් ගෝලීය සම්බන්ධතාවයන්ගෙන් පිරිපුන් සමූපකාර ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමේ අරමුණ කරා යාමට නොහැකි වී තිබුණි.

## 4.10 වාහන උපයෝජනය

මූල්‍ය කල්බදු ක්‍රමයට ලබාගෙන තිබූ කැබ් රථයක කල්බදු වාරික ගෙවා අවසන් කර ඇතත්, රථයේ අයිතිය ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.11 වෙළඳ පොළ කොටස

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිගණක විද්‍යාගාරය සතුව පරිගණක 84 ක් පමණ පැවතියද එයින් සියයට 77 ක් පමණ 2010 වර්ෂයේදී මිලදී ගත් වසර 05 කට වඩා පැරණි පරිගණක විය. ඉලක්කගත කණ්ඩායම අ.පො.ස (සා.පෙ.) හැදෑරූ වයස 16 ට වැඩි පරිගණක සාක්ෂරතාව සහිත පිරිසක් වීම මත යල් පැනගිය තාක්ෂණයක් සහිත මධ්‍ය සැකසුම් ඒකක (CPU) භාවිතා කිරීම නිසා පුහුණුලාභීන්ගේ ආකර්ශනය අඩුවී තිබුණි.

(ආ) පුහුණු මාර්ගෝපදේශය තුළ වෘත්තීය පුහුණු අංශය, ආයතන තුනක සම්පත් ඉගෙනුම් මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මකවන බව සඳහන් වුවද, විගණිත දිනය වන 2018 පෙබරවාරි 05 වන දින දක්වාම එම ආයතන හා සම්බන්ධව වන කිසිදු වෘත්තීය පාඨමාලාවක් ආරම්භ කර නොතිබුණි.

(ඇ) ආයතනයේ ආදායම් වර්ධනය කර ගැනීම සඳහා ඉලක්කගත කණ්ඩායම් ආකර්ශනය කර ගැනීමට මෙන්ම ආයතනයේ පාඨමාලා මතකයේ රැඳවීම උදෙසා විවිධ අලෙවි ප්‍රවර්ධන උපක්‍රම භාවිතා කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 මාර්තු 27 දිනදීය.

## 6.2 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක වුවත්, අභ්‍යන්තර විගණන අංශය පෙන්වා දුන් අභ්‍යන්තර පාලන දුර්වලතා නිවැරදි කරගැනීම කෙරෙහි කළමනාකරණය අවධානය යොමු කර නොතිබුණි.

## 6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලබේ.

(අ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව සැලසුම්කර තිබූ ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කරන දිනය හා අවසන් කරන දිනය දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සලැස්ම අනුව මිලදී ගැනීමට සැලසුම්කර තිබූ ශ්‍රවනාගාරය සඳහා වූ කැමරා පද්ධතිය, රූපවාහිණිය හා මුද්දර සීල් කිරීමේ යන්ත්‍රය (franking Machine) 2017 දෙසැම්බර් 31 දින වන විටද මිලදී ගෙන නොතිබුණි.

(ඇ) කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ රු.911,342 ක්වූ අවම ලංසුව ප්‍රතික්ෂේප කර එයට වඩා රු.167,658 ක් වැඩි ලංසුව ඉදිරිපත් කළ ආයතනයෙන් මිලදී ගැනීම සිදුකර තිබුණද පළමු ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුකිරීමට සැලසුම්කර තිබුණු ආයතනය සතු රජයේ නිවාස අලුත්වැඩියා කටයුතු සඳහා රු.මිලියන 7 ක් භාණ්ඩාගාරයෙන් වෙන්කර දී තිබුණද, එම කටයුතු වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

## 6.3 ආර්ථීක නොවූ ගනුදෙනු

ඇස්තමේන්තුගත වටිනාකම රු.2,151,777 ක්වූ නව රත්නායක නේවාසිකාගාරයේ විදුලි පද්ධතිය අලුතින් තැතදීම භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් රු.2,276,256 ක් වැය කර 2016 වර්ෂයේදී ඉටුකර තිබුණි. එසේ වුවද, නව තැතදීම් කිරීමෙන් පසුව ද පෙර තිබූ තත්ත්වයෙන්ම විදුලිය විසන්ධි වීමක් සිදුවන බැවින් මෙ සඳහා යොදවන ලද මුළු මුදලම ඵලදායි නොවන වියදමක් වී තිබුණි.

## 6.4 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනය හැකිතාක් නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කර අයවැයගත අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාකිරීම වෙනුවට ඉටුකරගත් අරමුණුවලට ගැලපෙන ලෙස අයවැය ලේඛනය වරින් වර සමාලෝචනය කර, සංශෝධිත අයවැය ලේඛනයක් පිළියෙල කර 2017 අගෝස්තු 03 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) සංශෝධිත අයවැයගත ආදායම සහ වියදම තත්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී විෂයයන් 17 ක සියයට 10 සිට සියයට 540 දක්වා විචලනයක් නිරීක්ෂණය විය.

## 6.5 නොවිසඳී ඇති විගණන ඡේද

පාලක මණ්ඩලයේ අනුමැතියකින් තොරව 2012 ජනවාරි 22 දින සිට 2015 ජනවාරි 03 දක්වා දින 59 කදී රාජකාරි ස්වරූපයේ නොවූ ගමන් සඳහා ආයතනයේ බස් රථය කි.මී.14,644 ක් ධාවනයේ යෙදවීම වෙනුවෙන් රු.1,034,765 ක මුදලක් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6.6 සමාජ වගකීම් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ පවිත්‍රතා හා උද්‍යාන සංවර්ධනය කිරීමේ සේවාව ඉටුකරනු ලබන ආයතනය ගිවිසුම් ප්‍රකාරව අවශ්‍ය රසායන ද්‍රව්‍ය හා උපකරණ ලබා දී නොතිබුණ අතර, සේවාවද විධිමත්ව ලබා දී නොතිබුණි.

(ආ) ආයතන පරිශ්‍රයේ නේවාසික කළමනාකරුගේ නිල නිවාසය ඉදිරිපස ඇති පැරණි තෙල් ටැංකිය වල් බිහි වී පැවති අතර නේවාසිකාගාර වලින් ඉවත් කරනු ලබන බෝතල්, පොලිතීන් හා අනෙකුත් අපද්‍රව්‍ය ඒ තුළට බැහැර කර තිබුණි. මේ තුළින් බාහිර අලංකරණය, නේවාසිකයින්ගේ හා නිලධාරීන්ගේ සෞඛ්‍ය තත්ත්වය හා මදුරුවන් බෝවීම වැනි අහිතකර බලපෑම් ඇතිවීමට ඇති ඉඩකඩ විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| පද්ධති හා පාලන | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු නොකිරීම, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් නොපැවැත්වීම හා ස්ථාවර වත්කම් ඌන උපයෝජනය. |
| (ආ) ගබඩා පාලනය | ගබඩා රාජකාරී කාර්යාල සහායකවරයෙකුට පවරා තිබීම හා ගබඩා ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (ඇ) සේවක පරිපාලනය | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම, නිලධාරීන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් අදාළ ආයතන වලින් තහවුරු කර නොගැනීම, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම කාලීනව සිදු නොකිරීම, නිලධාරීන්ට නියමිත කාලවලදී වාර්ෂික වැටුප් වර්ධක හා උසස්වීම් ලබා නොදීම. |
| (ඈ) කොන්ත්‍රාත් පරිපාලනය | ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබීම හා ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන්කළ මුදල් කාලීනව ප්‍රයෝජනයට නොගැනීම. |
| (ඉ) පුහුණු පාඨමාලා පැවැත්වීම | ප්‍රධාන අරමුණ වන සමූපකාර ප්‍රවර්ධනය සඳහා සැලසුම් සහගතව පුහුණු කටයුතු වර්ධනය කර නොගැනීම, පුහුණු පාඨමාලාවල ප්‍රගතිය අඩු මට්ටමක පැවතීම හා නවීන තාක්ෂණික ක්‍රම උපයෝගීකර ගනිමින් පුහුණුවීම් ප්‍රවර්ධනයට කටයුතු නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති